## 2014 – 02 – 05 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

**සහභාගීත්වය :-**

| | | |
|---|---|---|
| **01.** | එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| 02. | කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| **03.** | ඒ. පී. ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| **04.** | එච්. එල්. අනුර කිත්සිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 05. | පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **06.** | ග්‍රේෂන් කෙරමිණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **07.** | ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **08.** | ජේ. ඩබ්. භාෂිනි මේනුකා විජේසූරිය මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| **09.** | ජේ. ඩබ්. ජයන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **10.** | ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **11.** | කේ. එම්. චන්ද්‍රසිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **12.** | බී. ජනිත් වික්‍රමතිලක මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

☸ පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ. ව. **09.45** ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. ☸

## (01)

### 01:01 2014 – 01 – 07 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම

2014 – 01 – 07 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2014 – 01 – 07 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.**

**සංශෝධන 01**

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන**

2014 – 01 – 07 දින පැවති මාසික සභා වාර්තාවේ 8:33 යටතේ කර්මාන්ත අධිකාරිවරයා විසින් ප්‍රකාශ කරන ලද කොන්ක්‍රීට්වල වගකීම තමා භාර ගන්නා බව වාර්තාවට ඇතුලත් විය යුතු බව දන්වා සිටින ලදී.

**(02)** සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන — නැත

**(03)** ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

3.1 " පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2014 " මැයෙන් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අධ්‍යක්ෂතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මගින් පවත්වනු ලබන පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවට 2014 වර්ෂය සඳහා අයදුම්පත් කැඳවනු ලබන බවත් මේ සඳහා අයදුම් කිරීමට කැමති මහජන නියෝජිතයන් සහ නිලධාරීන් ඒ සඳහා අයදුම් කරන ලෙසත් සම්මුඛ පරීක්ෂණයක් මගින් පාඨමාලාව සඳහා පුහුණුලාභීන් තෝරා ගනු ලබන බවත් දන්වා තිබුණි.

**තීරණය**

☞ **මෙම පාඨමාලාව සඳහා අයදුම්කරන්නන් වෙනුවෙන් ගෙවිය යුතු පාඨමාලා ගාස්තු සභාව මගින් ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

3.2 " අන්තර් ක්‍රීඩා සමාජ ක්‍රීඩා උළෙල - 2014 " මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014 - XL වන ජාතික මහා ක්‍රීඩා උළෙලේ ප්‍රථම අදියරේ තරග යටතේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අන්තර් ක්‍රීඩා සමාජ තරග අම්බලන්ගොඩ පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණයේදී 2014 මාර්තු මස 01 දින ද අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩා පිට්යේදී 2014 පෙබරවාරි 15 දින සහ 2014 මාර්තු මස 07 සහ 08 යන දිනයන්හිදී ද පැවැත්වීමට බලාපොරොත්තු වන බවත් ඒ සඳහා එම දිනයන් සඳහා ක්‍රීඩාංගණ දෙක මුදල් අය කර ගැනීමකින් තොරව ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **අම්බලන්ගොඩ පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණය 2014 මාර්තු මස 01 දින සඳහාත් අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටිය 2014 පෙබරවාරි 15 දින සහ 2014 මාර්තු මස 07 සහ 08 යන දිනයන් සඳහාත් මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

- **පෙ ව 9.50 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා සභාවට පැමිණෙන ලදී.**
- **පෙ ව 9.50 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා සභාවට පැමිණෙන ලදී.**

3.3 “ පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණය ලබා ගැනීම ” මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ජාතික තරුණ සේවා සභාව වාර්ෂිකව සංවිධානය කරනු ලබන යෞවන ක්‍රීඩා උළෙලේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ යෞවන සමාජ අතර මළල ක්‍රීඩා උළෙල පැවැත්වීම සඳහා පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණය 2014- 03- 21 හා 22 යන දිනයන්හිදී නොමිලේ ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **යෞවන ක්‍රීඩා උළෙලේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ යෞවන සමාජ අතර මළල ක්‍රීඩා උළෙල පැවැත්වීම සඳහා පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණය 2014- 03- 21 හා 22 යන දිනයන්හිදී නොමිලේ ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

3.4 “ ආණ්ඩුකරණය හා දේශපාලනය පිළිබඳ සහතිකපත් පාඨමාලාව ” මැයෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශයේ අංශ ප්‍රධානි විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

කොළඹ විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයන අංශය මගින් ආණ්ඩුකරණය හා දේශපාලනය පිළිබඳ සහතිකපත් පාඨමාලාවක් හඳුන්වා දී ඇති බවත් මෙම පාඨමාලාව හැදෑරීමට උනන්දුවක් දක්වන මහජන නියෝජිතයන් හෝ සේවකයන් සිටී නම් මේ සඳහා අයදුම් කරන ලෙසත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ **ආණ්ඩුකරණය හා දේශපාලනය පිළිබඳ සහතිකපත් පාඨමාලාව හැදෑරීමට කැමැත්තක් දක්වන අය සිටිනම් ඒ සඳහා අයදුම් කිරීම සිදු කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

- **පෙ ව 10.00 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා සභාවට පැමිණෙන ලදී.**

3.5 “ පොල්වත්ත වෙළඳ සංකීර්ණයේ ජල සම්බන්ධතාවය ” මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

පොල්වත්ත වෙළඳ සංකීර්ණයේ 2013 ජනවාරි සිට අගෝස්තු දක්වා සාමාන්‍ය ජල පාරිභෝජන වියදම රු. 611.55 බවත් 2013 සැප්තැම්බර් මස පොදු ජල සම්බන්ධතාවයේ කාන්දුව නිසා නගර සභාව ගෙවිය යුතු ජල බිල රු. 44561.00 ක් බවත් මේ නිසා නගර සභාවට සිදුවී ඇති අලාභය රු. 43949.45 ක් බවත් මේ සම්බන්ධයෙන් ගත යුතු පියවර සම්බන්ධයෙන් සභාවේ උපදෙස් ඉල්ලා තිබුණි.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

සභාපතිතුමනි කඩ හිමියන් වෙන වෙනම ජල සම්බන්ධතා ලබා ගෙන තියෙන්නෙ. වෙළඳ සංකීර්ණයේ තියෙන වැසිකිළියෙ ප්‍රශ්නෙ තමයි ඔතන තියෙන්නෙ. අන්න් එක නගර සභාව මාසිකව බිල ගෙව්ව නම් ඕක වෙන්නෙ නෑ නේද.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**

සභාපතිතුමනි මම සභාවාර ගණනාවකදිම ඉල්ලීමක් කරා සතොස ගොඩනැගිල්ලෙ කඩවලට ජලය ලබා දෙන්න කියල. අද වෙනකොටත් කෙරීල නැහැ. එතන ලොකු ප්‍රශ්නයක් තියෙනවා වැසැකිළි පාවිච්චි කිරීමේදී.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සතොස ආයතනයෙන් ගෙවන්න ඕන බිලක් තියෙනවා. ජල සම්පාදන මණ්ඩලයේ නීතියක් තියෙනවා හිඟ බිලක් තියෙනව නම් වෙනත් කෙනෙක්ටවත් නැවත එම ස්ථානයටම සම්බන්ධතාවය දෙන්නෙ නැහැ. ලේකම් මහත්මයා සතොස ගොඩනැගිල්ලෙ තියෙන වැසිකිළියටත් ජලය අරගෙන දෙන්න. පොදු වැසිකිළියෙ බිල නිසා ඒක නගර සභාවෙන් ගෙවන්න කටයුතු කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**

සභාපතිතුමනි ජල සම්බන්ධතාවය අරගෙන දෙනව නම් කඩ හිමියන්ගෙන් එකතු කරල හරි බිල ගෙවන්නම්.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගණකාධිකාරිතුමා පොල්වත්තෙ සාප්පු සංකීර්ණයේ තියෙන පොදු වැසිකිළියෙ වතුර කපන එක සාධාරණ නැහැ. මෙතන වෙලා තියෙන්නෙ පොදු වැසිකිළියෙ කරාමෙ කැඩිල වතුර ගිහිල්ල බිල වැඩි වෙලා. ඇත්තටම අදාල නිලධාරීන් ඒවා සොයා බැලිය යුතුයි. මේකෙදි අපට යම් දෙයක් කරන්න පුලුවන්. කඩ හිමියන් එකතු වෙලා සමිතියක් පිහිටුවා ගෙන අපේ අදාල නිලධාරියා මාසෙකට සැරයක් ගිහිල්ල ඒ සමිතිය සමග රැස්වීමක් තියන්න. එතකොට ඒ අයගෙ අඩුපාඩු සොයා බලන්න පුලුවන්. එහෙම ගිහිල්ල බැලුව නම් මේ විදිය ප්‍රශ්න ඇති වෙන්නෙ නැහැ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි මම නිතර ඔතනින් යන නිසා දැකල තියෙනවා. ඔතන කැඩිලයි කියල මෙහෙට දැනුම් දීල. ඊත් දවස් පහකට විතර පස්සෙ තමයි මෙහෙන් බලන්න ගියේ. එතකොට වතුර ගිහිල්ල ඉවරයි. මේකෙ සම්පූර්ණ වගකීම නිලධාරීන් ගන්න ඕනෙ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දවස් පහක් එක දිගට වතුර ගියත් මෙතරම් ගානක් වෙන්න බැහැ. මෙතන මොකක්හරි ප්‍රශ්නයක් තියෙනවා. ඒ නිසා මේ ගැන අභ්‍යන්තර විගණන නිලධාරී මහත්මිය පරීක්ෂණයක් කරන්න.

**තීරණය**

☞ මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන නිලධාරී මහත්මිය විසින් පරීක්ෂණයක් සිදු කර ඊලග සභා වාරයට වාර්තාවක් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කිරීමට සභාව තීරණය කරන ලදී.

3.6 " අම්බලන්ගොඩ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩු පිරවීම " මැයෙන් ගාල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ අම්බලන්ගොඩ නගර සභා තේරීම්භාර නිලධාරීතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාවේ සභික ධුරයේ ඇති වූ පුරප්පාඩුව පිරවීම සඳහා 2014 ජනවාරි මස 23 වන දින සිට පුවන්වඩු භාෂිනී මේනුකා විජේසූරිය මහත්මිය පත්කරන බවත් ධුර කාලය ආරම්භ වී මාසයක කාලයක් ඇතුලත ව්‍යවස්ථාවේ සඳහන් තැනැත්තෙකු ඉදිරියේ දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් දීම සිදු කල යුතුව ඇති බැවින් ඒ සඳහා සභාවේ ලේකම්වරයා විසින් විමසා සිටින ලෙසත් දන්වා තිබුණි.

**තීරණය**

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී .**

**(04)** යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ **නැත**

**(05)** යථා පරිදි කල්දී ඇති යෝජනා

**5:1** **ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා** නැත

**5:2** **නිලධාරීන් විසින් ඉදිරිපත් කරන පරිපාලන යෝජනා** :

**05:02:01** " පහත විස්තර කරනු ලබන ඉඩම දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුව උතුර අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 86E ඕකන්ද ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බලයලත් මිනින්දෝරු පී. එම්. ද සිල්වා මහතා විසින් 2008-11-14 දින මැන පිළියෙල කරන ලද අංක 950 දරණ පිඹුරේ නිරූපිත

ඉහත කී අම්බලන්ගොඩ පොල්වත්ත ගමේ පිහිටි හෙරලියගොඩැල්ල නැමති ඉඩමේ අංක 01 දරණ ඉඩම් කැබැල්ල නම් වූ

| | | |
|---|---|---|
| උතුරට | :- | විහාරගොඩ මාවත |
| නැගෙනහිරට | :- | කැබලි අංක 02 |
| දකුණට | :- | කැබලි අංක 81 පාර |
| බස්නාහිරට | :- | විහාරගොඩ මාවත |

මායිම් තුල පිහිටි පර්. 07.00 ක් වන ඉඩම් කැබැල්ල ගාල්ල හේවගේ ජගත් යන අයට පවරා දීමට යෝජනා කරමි. "

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි මේක කාලයක් තිස්සෙ තිබුණ ප්‍රශ්නයක්. කලින් ඉදිරිපත් කරපු යෝජනාව විදිමත් නැහැයි කියල නැවතත් මේ යෝජනාවක් ඉදිරිපත් කරේ.

ඉහත සඳහන් යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

<u>තීරණය</u>

☞ **දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුව උතුර අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 86E ඕකන්ද ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බලයලත් මිනින්දෝරු පී. එම්. ද සිල්වා මහතා විසින් 2008-11-14 දින මැන පිළියෙල කරන ලද අංක 950 දරණ පිඹුරේ නිරූපිත පොල්වත්ත ගමේ පිහිටි හෙරලියගොඩැල්ල නැමති ඉඩමේ අංක 01 දරණ පර්. 07.00 ක් වන ඉඩම් කැබැල්ල ගාල්ල හේවගේ ජගත් යන අයට ගරු අමාත්‍යතුමාගේ අනුමැතියෙන් පසුව පවරා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**05:02:02**

<u>**"නොමිලේ අභ්‍යා ස පොත් බෙදි දීම - 2013**</u>
<u>**වෙනුවෙන් දරණ ලද වියදම් සඳහා අනුමැතිය ලබා ගැනීමේ පරිපාලන යෝජනාව්,**</u>

අම්බලන්ගොඩ නගර සභාව මගින් බල ප්‍රදේශයේ පදිංචි පාසල් දරු දැරියන් **2262** ක් සහ නගර සභාවේ සේවයේ නියුතු නිලධාරී සේවක මහත්ම මහත්මීන්ගේ දරු දැරියන් **154** ක් හා පිරිවෙන් හි ගිහි පැවිදි සිසුන් **48** ක් වශයෙන් මුළු ශිෂ්‍යග සංඛ්‍යාස**2464** ක් වෙනුවෙන් 2014 වර්ෂයට අදාළව අභ්‍යාúස පොත් බෙදා දීම සඳහා දරණ ලද වියදම පහත පරිදි වේ.
මෙම වියදම දැරීම සම්බන්ධයෙන් ගරු සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

| | | | |
|---|---|---|---|
| අභ්‍යාාස පොත් සඳහා වියදම | - රු. | | 1810698.00 |
| ඡායාරූප ඇල්බමය සඳහා | - රු. | | 15880.00 |
| ප්‍රචාරණ වියදම්(පෝස්ටර්) ස දහා | - රු. | 5 | 250.00 |
| වෙනත් අතිරේඛ වියදම් - | රු. | | 22967.00 |
| මුළු එකතුව | - රු. | | **1854795.00** |

**නොමිලේ අභ්‍යාමස පොත් බෙදා දීම වෙනුවෙන් දරණ ලද රු .1854795.00ක මුදල සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.**

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහිදී මම සඳහන් කල යුතුයි ළමුන් 2464 ක් සඳහා අපි අභ්‍යාස පොත් ලබා දීම සිදු කරා. ඒ වෙනුවෙන් අපි **දරණ ලද** වියදම **රු .1854795.00 ක මුදලක්**. අපි මේ කටයුත්ත කරේ ඇත්තටම දරුවන්ගේ යහපත උදෙසා. සෑම පාසලකින්ම විදුහල්පතිතුමාගෙන් ඒ ඒ වසරට අදාල පොත් ලැයිස්තු ගෙන්වාගෙන ඒ අනුව තමයි පොත් කට්ටල ලබා දීම සිදු කරේ. දරිද්‍රතාවයකින් පෙළෙන දරුවන් බලල තමයි අපි මේ කටයුත්ත කරේ. ඒ අනුව දරුවන්ට සමාන අයිතිවාසිකම් ඇති කිරීම සඳහා ගත්ත ප්‍රයත්නයක් මේක. ඒ දරුවන් වෙනුවෙන් අපට කල හැකි දේ තමයි අපි මෙහිදි කලේ. වෙනත් නගර සභාවලින් නොකරන දෙයක් තමයි මේ කටයුත්ත. අම්බලන්ගොඩ නගර බුද්ධිමතුන්ගේ පාරාදීසයක්. ආර්ථික වශයෙන් අපහසුතා ඇති දරුවන් වෙනුවෙන් නගරයට රටට වැඩදායි පිරිසක් බිහි කිරීමේ අරමුණින් කරපු කටයුත්තක්. මෙහිදී අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් අපෙන් ඉල්ලීමක් කරා විශාල මුදලක් වියදම් කරල මේකට උත්සවයක් පවත්වන්නෙ නැතුව මේක පන්සල් වලට ප්‍රජාශාලා වලට ගිහිල්ල කරන්න කියලා. අපි එයට ඇහුම්කන් දීල ඒ අයුරින් තමයි මෙවර පොත් බෙදා දීම සිදු කරේ. ඒ සම්බන්ධයෙන් විපක්ෂ නායකතුමා ප්‍රමුඛ මනිත්‍රීවරුන්ට අපි ස්තූතිය පුද කරනවා. අපි දන්නවා රජයේ සේවකයෙක් වුනත් දරුවන් තුන් දෙනෙක් හතර දෙනෙක් ඉන්නව නම් ඒ අයට ළමයින්ට පොත් අරගෙන දෙන්න සෑහෙන මුදලක් යනවා. ඒ නිසා නගර සභාව කරනු ලබන සත් කාර්ය අතරින් ඉතාම සුවිශේෂී කටයුත්තක් ලෙස අපි මෙය දකිනවා. මෙහිදී විශේෂයෙන්ම අපේ කාර්ය මණ්ඩලය ප්‍රජා සංවර්ධන නිලධාරි තුමිය ඇතුලු සියලුම දෙනා ඒවගේම නගර සභාවේ සේවකයින් විශාල මෙහෙයක් කලා. විශේෂයෙන්ම සුලු සේවකයින් ඔවුන්ගේ නිවාඩු දවස්වල තමයි ඔවුන් මේ වැඩ කටයුතු වලට සහභාගි වුනේ. එක දවසක උත්සවයක් වගේ නෙමෙයි උත්සව 15 ක් කරා. මේක බොහොම කරදර විඳිමින් කරේ. නමුත් මේ අය මෙම කාර්ය දරුවන් වෙනුවෙන් කරපු සත් කාර්යක් නිසා කැමැත්තෙන් තමයි කරේ. එම නිසා නගර සභාවේ සමස්ථ මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් මම මේ අවස්ථාවේදී වශේෂයෙන්ම ඒ සම්බන්ධයෙන් ස්තූතිය පුද කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි විශාල දරුවන් ප්‍රමාණයක් වෙනුවෙන් නොමිලයේ පාසැල් පොත් ලබා දීමට උරදීම පිළිබඳව සහ ඒ සම්බන්ධව නායකත්වය ගෙන කටයුතු කිරීම සම්බන්ධව අපි ඔබතුමාට අනේක වාරයක් ස්තූතිවන්ත වෙනවා. පසුගිය වසරවල් වලට වඩා බොහොම සංවිධානාත්මකව ඔබතුමා මහජනතාවට සමීප වන අයුරින් මේ කටයුතු සිදු කලා. මේ කටයුතු සඳහා ඔබතුමාගේ පසුපස යමින් ඒ සියල්ලටම දායක වුනා. ඒවගේම කාර්ය මණ්ඩලය නොයෙකුත් පීඩා මධ්‍යයේ ඒ කටයුතු සාර්ථකව ඉටු කිරීම සම්බන්ධව මම ස්තූතිවන්ත වෙනවා.

ඉහත සඳහන් යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණය</u>**

☞ **නොමිලේ අභ්‍යාසස පොත් බෙදා දීම වෙනුවෙන් දරණ ලද රු .1854795.00 ක මුදල සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

## (06) කාරක සභා වාර්තා සලකා බැලීම

**6: 1** **2013- 12- 30** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>අම්බලන්ගොඩ නගර සභාව - ක්‍රීඩා කමිටු රැස්වීම</u>

දිනය - 2013.12. 30
ස්ථානය - නගර සභා රැස්වීම් ශාලාව
වේලාව - ප.ව. **2.30**

**<u>සහභාගීත්වය</u>**

භාරත සමරසේකර - ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව
ඇම්.ඩබ්.කේෂාන් ප්‍ර3භාත් මහතා - ඩොල්ෆින් ජල ක්‍රී ඩා සමාජය
මහේන්ද්‍ර. වික්‍රමමසිංහ මහතා - ක්‍රී-ඩා කමිටු සාමාජික
ඉඳුනිල් එදිරිවික්‍රවමසූරිය මහතා - පාපන්දු පුහුණුකරු අම්බලන්ගොඩ නගර සභාව
කේ.ජේ.තාබ්රේයව් මහතා - සොනෙල් ක්‍රි්ඩා සමාජය
එම්.ඩබ්.ෂර්ලි චන්ද්‍රසිරි මහතා - ක්‍රීඩා කමිටු සාමාජික
ජේ.ජයවීර මහතා - රියෝ ක්‍රීඩා සමාජය
ආර්.ජී.නිමල් මහතා - සිංහ ක්‍රීීඩා සමාජය
එච්.වයි. ද සිල්වා මහතා - ක්‍රීීඩා භූමි භාරකරු - නගරසභාව
ඩබ්.පී.සිල්වා මිය -
සංවර්ධන සහකාර (ප්‍ර්.සං. නිලධාරී වැ.බ)

**පිළිගැනීම - ලේකම් - භාරත සමරසේකර මහතා.**

ක්‍රීගඩා කමිටුව සඳහා කිරා-මඩා සමාජ නියෝජනය කරමින් පැමිණි නිලධාරීන්, ක්‍රිෑඩා කමිටු සාමාජික මහතුන් හා නගර සභා කාර්ය මණ්ඩලය ඉතාමත් ගෞරවයෙන් පිළි ගනිමින්, ගරු සභාපතිතුමා අත්‍යාභවශ්‍යර රාජකාරී කටයුක්තක් සඳහා කාර්යාලයෙන් බැහැරව ගොස් ඇති බවත් , කමිටුව පවත්වාගෙන යැමට උපදෙස් දුන් බවත් ප්‍රයකාශ කරන ලදි.

ඉන් අනතුරුව න්‍යා්ය පත්‍රා්නුකූලව ප්‍ර.ථමයෙන්ම පසුගිය ක්‍රිාඩා කමිටු රැස්වීමේ කරුණු සමාලෝචනය කිරීම සිදු කරන ලදි.

**අදහස් හා යෝජනා**
**ජේ.ජයවීර**
**නගර සභා ක්‍රීජඩා පිටියේ ක්‍රිකට් තරග පැවැත්වෙන අවස්ථාවේදී එහි රේඛා සලකුණු කිරීම සඳහා එක් සේවකයෙකු පමණක් යෙදවීම ප්‍රපමාණවත් නොවන බව කියා සිටින ලදි.**
**තවද එනිසා ක්‍රි ඩා තරග පැවැත්වෙන අවස්ථාවලදි එක් එක් අයගේ දෝෂ දර්ශනයට ලක් වීමට සිදු වු අවස්ථා තිබූ බව කියා සිටින ලදි. එවැනි අවස්ථා වලදී ක්‍රි ඩා උන්නතියට විශාල කැපකිරීමක් කරන අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති තුමා හටත් චෝදනා එල්ල වන බව කියා සිටින ලදි.**

**මහේන්ද්‍රො වික්‍රාමසිංහ මහතා**
දේවානන්ද විද්‍යාසලයේ පැත්තේ ඇති කාණුව වසා වසා දැමීම පිළිබඳ අදහස් විමසන ලදි.

එහිදී ඇල්ටන් මහතා කියා සිටියේ කාණුවට කෝන්ක්‍රීට් කැබලි දැමීම සඳහා කාර්මික නිලධාරී වාර්තාවක් ලබා ගැනීමට නියමිත බවයි.

**මහේන්ද්‍රම වික්‍රමසිංහ මහතා**
ක්‍රීඩා මණ්ඩපය අසල ප්‍රදේශය අපිරිසිදුව පවතින බවත් එම ස්ථානය ජේ.සී.බී. යන්ත්‍ර යක් ආධාරයෙන් කුණු ඉවත් කර පිරිසිදු කිරීම සඳහා කටයුතු කර දෙන ලෙසත් ඉල්ලීමක් කරන ලදි.

**ලේකම් මහතා**
ඒ සඳහා කරන්දෙණිය ප්‍රා දේශිය සභාවේ හෝ බෙන්තර ප්‍රාකදේශිය සභාවේ ජේ.සී.බී. යන්ත්‍ර යක් ගෙන්වා ගැනීමට ඉල්ලීමක් කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදි.

**ඇම්.ඩබ්.කේෂාන් ප්‍රදහාත් මහතා**
ජීවිත ආරක්ෂමක ඇඳුම් කට්ටල ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන ලදි. එම ජීවිත ආරක්ෂවක ඇඳුම් කට්ටල පටබැඳිමුල්ල ප්‍රජා ශාලාවේ තිබෙනවාද කියා විමසීම් කරන ලෙසත් ඉල්ලා සිටින ලදි.

මාදම්පා ගඟ පිහිනුම් තටාකය අසල ගඟට යන ස්ථානයේ ඉවුර ඛාදනය වන බවත් එය කළු ගල් දමා සකස් කර දෙන ලෙසත් ඉල්ලීමක් කරන ලදි.

**ජේ.ජයවීර**
ක්‍රී ඩා මණ්ඩපය ඉදිරි පිට නිතර නිතර අපිරිසිදු කරන බැවින් ඒ සඳහා ආරක්ෂාක ක්‍රමයක් ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදි.

තවද ක්‍රීඩා මණ්ඩපය ඉදිරිපස ඇති වාහන රථ ගාල නිසා මහත් අවහිරතා වලට මුහුණ දීමට සිදුවන බැවින් එම රථ ගාල ඉවත් කර වන ලෙසත් ඉල්ලා සිටින ලදි.

එමෙන්ම ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය වෙත එන තාර පාරේ වාහන වේගයෙන් පදවන බැවින් එම වේගය පාලනය කිරීම සඳහා බම්පර් දෙකක් දමන ලෙස ඉල්ලා සිටින ලදි.

නගර සභා පිට්ටනිය අසල පිහිටා ඇති පන්සලේ ඇති ගස්වැල් වලින් අවහිර වී ඇති බවත් එම ගස් වැල් කපා සුද්ද කරවා දෙන ලෙසත් තව දුරටත් ඉල්ලා සිටින ලදි.

**ලේකම්තුමා**
ඒ පිළිබඳව කරිත්ත කන්ද සුභද්‍රා රාම විහාරස්ථානයේ විහාරාධිපති සිරි නන්ද ස්වාමීන් වහන්සේ දැනුවත් කරන ලෙස දන්වන ලදි.

එම්.ඩබ්.ෂර්ලි චන්ද්‍රසිරි මහතා
ක්‍රීඩා පිට්ටනිය වෙත හරකුන් පැමිණීම වැලැක්වීම සඳහා පිට්ටනිය වටේ ඇති කාණුව වටේට බිමට යකඩ බම්බු සවි කරන ලෙස ඉල්ලා සිටින ලදි.

ජේ.ජයවීර මහතා
නගර සභාව මගින් නගර ක්‍රී ඩා තරඟ පැවැත්වීම මගින් , නගර සභා පාපන්දු සංචිතය මගින්, ක්‍රීතකට් පුහුණු ආයතනය මගින් ක්‍රීඩකයින් පුහුණු කර ජාත්‍යන්තර තලය දක්වා යැවීමට සමත්වී ඇති බවත් , ක්‍රීඩකයින් සඳහා එම අවස්ථා ලබා දීම සම්බන්ධයෙන් නගර සභාවේ ගරු සභාපති තුමා , නගර සභා මන්ත්‍රීත වරුන්ටත් , පුහුණු කරුවන්ටත් ස්තුතිය එල කර සිටින ලදි.

ඩබ්.පී.සිල්වා මිය - ස්තුති කථාව
අද දින තම වටිනා කාලය හා ශ්‍රමය කැප කරමින් කමිටුව වෙත පැමිණ අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම වෙනුවෙන්, ක්‍රීඩා සමාජ , පාසල් නියෝජනය කරමින් පැමිණි නිලධාරින් හා නගර සභාවේ නිලධාරීන් ඇතුළු සියළුම මහත්ම මහත්මීන්ට ස්තුතිය පල කරමින් කමිටුවේ කටයුතු අවසන් කරන ලදි.

සකස් කළේ - ඩබ්ලිව් .පී.සිල්වා මිය
සංවර්ධන සහකාර /ප්‍රජා සංවර්ධන නිලධාරී ( වැ.බ.)

**ඒ අනුව 2013 -12- 30 දින පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 2** **2014- 01- 23** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදි.

**පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව**
**2014.01.23 ප.ව. 2.30**

**සහභාගීත්වය**

| | |
|---|---|
| ❖ භාරත සමරසේකර මයා | ලේකම් අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ වෛද්‍ය පී.ආර්.එන්.ද.සිල්වා මහත්මිය. | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනී අම්බලන්ගොඩ, |
| ❖ එම්.එච් නිහාල් රණසූරිය මහතා. | පරිපාලක ම. සෞ. පරීක්ෂක, සෞ.වෛ.නි. කාර්යාලය |
| ❖ පී. එස්. එස්. ද සිල්වා මහතා. | ම. සෞ. පරීක්ෂක, අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ එල්.පී.එස් හේමකානන්ති. | ප්‍රදේශිය පරිසර නිලධාරී. |
| ❖ එච්. නයනා චාන්දනි මහත්මිය. | සංවර්ධන සම්බන්ධීකාරක ප්‍රා.ලේ. අම්බලන්ගොඩ. |
| ❖ පී. එච්. එල්. සී. පුෂ්පරාණි මහත්මිය. | සං සහකාර, අම්බලන්ගොඩ නගර සභාව, |
| ❖ බී.ඩී.ඊ කොඩිතුක්කු මහත්මිය. | ප.සෞ.සේ නිලධාරී අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ ඩී.එස් ඊ ගමගේ මහත්මිය. | ප.සෞ.සේ නිලධාරී අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ පී. කුසුම් ද සිල්වා මහත්මිය. | කළමණාකරණ සහකාර |
| ❖ එම්.ඩබ්.එච්.එස්.චිත්‍රාවංශ | සෞඛ්‍ය පරිපාලක |

❖ **පිළිගැනීම** :- අම්බලන්ගොඩ නගර සභාවේ ලේකම් භාරත සමරසේකර මයා

සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව සඳහා පැමිණි සෞ.වෛ.නි. මිය ඇතුළු අනෙකුත් සියලුම රජයේ නිලධාරි මහත්ම මහත්මීන් නගර සභා කාර්‍ය මණ්ඩලයත් ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි. ඉන් අනතුරුව එළඹියේ පසුගිය රැස්වීමේ සාකච්ඡා වු කරුණු සමාලෝචනයක යෙදීමයි.

**ගර්භණී මව්වරුන් සඳහා චීත්ත රෙදි ලබා දිම හා පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**
**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනී වෛද්‍ය පී.ආර්.එන් ද සිල්වා මිය.**
2014 වර්ෂයේ බලාපොරොත්තුවන ප්‍රසව දිනය යෙදෙන මව්වරුන්ගේ නාම ලේඛනය සකස් කර ඇති අතර එහි අඩුපාඩු පවතින බැවින් එම තොරතුරු ලැබුනු විගස ලබා දීමට කටයුතු කරන බව පවසන ලදි.

**තීරණය**
එම ලැයිස්තුව ලැබුණු පසු චීත්ත රෙදි ලබා දීමට තීරණය කරන ලදි.

**සෞඛ්‍ය වෛද්‍ය සායනය පිළිබඳ සාකච්ඡා කිරීම.**

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනී වෛද්‍ය පී.ආර්.එන් ද සිල්වා මිය.**

දන්ත ශෛල්‍යාගාර බස් රථය හා ජංගම රසායනාගාර බස් රථය අලුත්වැඩියා කටයුතු සඳහා යොමු කර ඇති බව දැනගන්නට ලැබුණු බවත් ජනවාරි 28 දිනට පෙර අලුත්වැඩියා කටයුතු අවසන් වුවහොත් බස් රථ ලබා දීමට හැකි බව පවසන ලදි.

**අම්බලන්ගොඩ ප්‍රා.ලේ. කාර්යාලයේ සංවර්ධන සම්බන්ධීකාරක එච්. නයනා චාන්දනි මහත්මිය.**

ග්‍රාම නිලධාරීන් සඳහා 28 දින රැස්වීමක් පැවැත්වෙන බැවින් මෙම දිනය හැකි නම් වෙනස් කරන ලෙස ඉල්ලීමක් කරන ලදි.

**තීරණය**

28 දින පැවැත්වීමට නියමිත සායනය බස් රථ අලුත්වැඩියා කිරීමෙන් අනතුරුව පැවැත්වීමට තීරණය කරන ලදි.

**තල්ගස්ගොඩ ප්‍රදේශයේ අයාලේ යන සුනඛයන් සම්බන්ධ ගැටළුව වර්තමාන තත්වය**

**අම්බලන්ගොඩ නගර සභාවේ ලේකම් භාරත සමරසේකර මයා**

මේ සම්බන්ධයෙන් දැනට ලැබී ඇති ලිපි පිළිබඳ විස්තර කරන ලදි.

**ම. සෞ. පරීක්ෂක, පී. එස්. එස්. ද සිල්වා මහතා.**

තවත් සායනයක් ළගදීම අම්බලන්ගොඩ නගර සභාවට ලැබෙන බවත් පවසන ලදි.

**තීරණය**

ලැබී ඇති ලිපිවලට අවධානය යොමු කර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ලිපියක් දැමීමට තීරණය කරන ලදි.

**E-WAST ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩසටහන.**

අම්බලන්ගොඩ නගර සභාවේ ලේකම් භාරත සමරසේකර මහතා.

හික්කඩුව නගර සභාවේ ගරු සභාපතිතුමා විසින් යොමු කරන ලද **E-WAST ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩසටහන පිළිබඳ** ලිපිය කමිටුවට ඉදිරිපත් කරන ලදි.

**සංවර්ධන සහකාර පී.එච්.එල්.සී පුෂ්පරාණි මිය**

මෙම ලිපියට අදාළව බැරලෝහ ගණයට අයත්වන රූපවාහිණි යන්ත්‍ර.කැසට් රේඩියෝ, ,ජංගම දුරකතන යන්ත්‍ර, ආදිය එකතු කිරීම සඳහා නගරයේ රජයේ පාසල් හා කාර්යාල සඳහා ඉහත සඳහන් ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය ඇත්නම් 2014.01.27 දිනට පෙර නගර සභා භූමිය වෙත ගෙනවිත් භාර දෙන ලෙස දන්වා ලිපි යවා ඇති බවත් 2014ග01ග28 දින එකතුවන ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය හික්කඩුව නගර සභාව වෙත ප්‍රවාහනය කිරීමට බලාපොරොත්තු වන බවත් පවසන ලදි.

පරිපාලක ම. සෞ. පරීක්ෂක එම්.එච් නිහාල් රණසූරිය මහතා.

මෙය ඉතා හොඳ වැඩසටහනක් බවත් මෙය වඩාත් විධිමත් කිරීම සඳහා ප්‍රචාරක කටයුතු සිදු කිරීම වඩාත් සුදුසු බවත් පවසන ලදි.

**ධර්මාශෝක විද්‍යාලයේ 2014.01.25 දින පැවැත්වීමට නියමිත ශ්‍රමදාන වැඩසටහන**

**ම. සෞ. පරීක්ෂක, පී. එස්. එස්. ද සිල්වා මහතා.**

එම ශ්‍රමදානය සඳහා අවශ්‍ය උපකරණ ලබා දිමට අනුමැතිය ලැබී ඇති බවත් ඒවා ලබා දිමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බවත් බවසන ලදි.

- ❖ **වෙනත් කරුණු**

**ම. සෞ. පරීක්ෂක, පී. එස්. එස්. ද සිල්වා මහතා.**

සෞඛ්‍ය අංශයේ කසල ව්‍යාපෘතිය යටතේ සේවය කරන සේවකයන්ගේ පීව දත්ත තොරතුරු කිසිවක් එක් රැස් කර නොමැති බැවින් එක් එක් පුද්ගලයාට වෙන් වෙන් වශයෙන් ලිපිගොණු ආරම්භ කර ඔවුන්ගේ උප්පැන්න සහතික හා ජාතික හැදුනුම්පත් වල ඡායා පිටපත් ඇතුලත් කර ලිපිගොණු සකස් කර ඇති බවත් එම ලිපිගොණු **17** ක් විෂය භාර නිලධාරිනියට භාර දෙන බවත් පවසන ලදි.

**අම්බලන්ගොඩ නගර සභාවේ ලේකම් භාරත සමරසේකර මයා**

ම. සෞ. පරීක්ෂක,වැඩ බැලිමේ දීමනාව ලබා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු වශයෙන් වැඩ බැලීමේ පත්වීම් ලිපියක් ලබා ගැනීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් මගින් සෞඛ්‍ය අමාත්‍යංශ ලේකම් වෙත දැනටමත් ලිපියක් යවා ඇති බව පවසන ලදි.

**ම. සෞ. පරීක්ෂක, පී. එස්. එස්. ද සිල්වා මහතා.**

අත් මේස් හා පා ආවරණ (බූට්ස්) ලබා දෙන ලෙස ඉල්ලීම් කළ ද මෙතෙක් ඒවා නොලැබුණු බව පවසන ලදි.

**සෞඛ්‍ය පරිපාලක එම්.ඩබ් එච් එස්.චිත්‍රාවංශ**

ප්‍රථමාධාර පෙට්ටියේ බෙහෙත් අවසන් වී ඇති අතර නැවත එම බෙහෙත් ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන ලදි. බස් නැවතුම්පල උඩු මහලේ වැසිකිළිය පාලනය කිරිම අපහසු බවත්, වැසිකිළි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විශාල වියදමක් දැරීමට සිදුවන බැවිනුත්,වැසිකිළිය ටෙන්ඩර් කිරීම සුදුසු බව යෝජනා කරන අතර මේ පිළිබඳව සභාපතිතුමාගේ අවධානයට යොමු කර ඇති බව ද පවසන ලදි.

**<u>ස්තූති කථාව</u>**

**සංවර්ධන සහකාර පී.එච්.එල්.සී පුෂ්පරාණි මිය**

අම්බලන්ගොඩ නගරයේ සෞඛ්‍ය කටයුතු සාර්ථකව ඉටු කිරීම සඳහා සභාපතිතුමා ගන්නා වූ ප්‍රයත්නයට ස්තූතිය පුද කරමි. අද දින රැස්වීම සඳහා පැමිණි සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ට ස්තූතිය පුද කරන බව ප්‍රකාශ කරන ලදී.

ප.ව.4.15 ට පමණ රැස්වීමේ කටයුතු නිම කරන ලදී.

සකස් කළේ :
පී.එච්.එල්.සී.පුෂ්පරාණි.
සංවර්ධන සහකාර (සැලසුම්)

**ඒ අනුව 2013 -01- 23 දින පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි දැනට සභාවේ වැඩ බැලීම සඳහා යොදවා ඇති මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාට දීමනා ගෙවීම සම්බන්ධව තත්වය මොකක්ද? ඒ ගෙවීම් සිදු නොකර ඒ මහතා රාජකාරී කටයුතු සිදු නොකෙරුවොත් මොකක්ද ඇතිවන තත්වය.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි සභාවෙන් අනුමැතිය දුන්නානේ එතුමාගේ ගෙවීම් කරන්න. ඇයි ගණකාධිකාරීතුමා ඒ ගෙවීම් කරන්න බැරි. ඒ රාජකාරිය වගකිව යුතු එකක්. හැමෝටම ඒක කරන්න බැහැ. ඉතින් ඇයි ගෙවන්න බැරි.

ගණකාධිකාරීතුමා මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාගේ වැඩ බැලීමේ දීමනාව, දුරකථන සහ ඉන්ධන දීමනාව ඒ මහතා වැඩබැලීමට පැමිණි දිනයේ සිට ගෙවීමට කටයුතු කරන්න නීත්‍යානුකූල තත්වය පිළිබඳ විමසීම් කර ඉදිරි කටයුතු කරන්න.

**මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාගේ වැඩ බැලීමේ දීමනාව, දුරකථන සහ ඉන්ධන දීමනාව වැඩබැලීමට පත්කල දින සිට ගෙවීම් කිරීමට සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කරනු ලදුව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 3** **2014- 01- 22** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>අම්බලන්ගොඩ නගර සභාවේ ගරු උපසභාපතිතුමා මූලාසනය දැරූ 2014/01/22</u>**

**<u>දින පැවැති පුස්තකාල කමිටු වාර්තාවයි</u>**

| | |
|---|---|
| ▪ භාරත සමරසේකර මහතා | ලේකම් නගර සභාව |
| ▪ ඩී.වී. තරංගි මිය | ප්‍රජා සංවර්ධන නිලධාරි |
| ▪ ටී. නදීකා නිල්මිණී මෙනෙවිය | සංවර්ධන නිලධාරී |
| ▪ කේ.ඩබ්.ආර්. මානෙල් මෙනෙවිය | පුස්තකාලයාධිපතිනි |
| ▪ ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා | කමිටු සාමාජික |
| ▪ පී.ඩබ්. ගුණසිරි මහතා | කමිටු සාමාජික |
| ▪ එන්.එම්. ධන්කන් ද සිල්වා මහතා | කමිටු සාමාජික |
| ▪ සිරිපාල මාදුවගේ මහතා | කමිටු සාමාජික |
| ▪ ටී.ඩබ්. හරිස්චන්ද්‍ර මහතා | කමිටු සාමාජික |
| ▪ පී.එච්.එල්. පියන්ති මෙනෙවිය | පුස්තකාල සාහායිකා |
| ▪ ඒ.ඩබ්. ඉන්ද්‍රදාස මහතා | පුස්තකාල සාහායක |
| ▪ ගෞරි වර්සවිතාන මිය | පුස්තකාල සාහායිකා |
| ▪ එම්.ඩබ්.ජේ. සුමංගලී මිය | පුස්තකාල සාහායිකා |
| ▪ ඒ.පී. රසිකා මිය | පුස්තකාල සාහායිකා |
| ▪ කේ.ඒ. විසුද්දි රේණුකා මිය | පුස්තකාල සාහායිකා |
| ▪ මාලති ආරියසිංහ මිය | පුස්තකාල සාහායිකා |
| ▪ එස්.එම්. මනෝරි චන්ද්‍රවංශ මිය | පුස්තකාල සාහායිකා |
| ▪ ඒ.පී. ලක්ෂ්මී පෙරේරා මෙනෙවිය | පුස්තකාල සාහායිකා |

ගරු සභාපතිතුමාට අත්‍යාවශ්‍ය කාර්යකට යාමට සිදුවූ බැවින් ගරු උපසභාපති තුමා විසින් මූලාසනය උසුලන ලදී. උපසභාපතිතුමා කමිටුවට පැමිණි මහත්ම මහත්මීන් පිළිගැනීමෙන් පසු එදින ප.ව. 2.30 ට සභාවේ වැඩ ආරම්භ කළේය.

- **පුස්තකාල ප්‍රගති වාර්තා කමිටුවට ඉදිරිපත් කිරීම පළමුව සිදුවිය**

ප්‍රධාන පුස්තකාලයේ ප්‍රගති වාර්තාව පුස්තකාලයාධිපතිනිය විසින්ද අනෙකුත් ශාඛා පුස්තකාලවල ප්‍රගති වාර්තා ඒ ඒ ශාඛා භාර නිලධාරින් විසින්ද ඉදිරිපත් කරන ලදී. විද්‍යුත් පුස්තකාලයේ වාර්තාව සංවර්ධන නිලධාරි ටී. නදීකා නිල්මිණී මෙනෙවිය විසින් ඉදිරිපත් කරන ලදී.

**අදහස් හා යෝජනා:-**

■ කමිටු සාමාජික සිරිපාල මාදුවගේ මහතා කියා සිටියේ විශ්‍රාමලත් විදුහල්පති කමිටු සාමාජික බී.එච්. එච්. විමලදාස මහතාගේ අභාවය වෙනුවෙන් එතුමාට ශෝකය ප්‍රකාශ කිරීම සඳහා විනාඩියක නිශ්ශබ්දතාවයක් පල කරන ලෙසයි. බී.එච්. එච්. විමලදාස මහතාගේ භාර්යාවට හා දරුවන්ට එතුමා කළ සේවාව වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කර ලිපියක් යැවීමට කටයුතු කරන ලෙස ගරු උපසභාපතිතුමා පුස්තකාලයාධිපතිනියට උපදෙස් දුන්නේය.

■ ගියවර කමිටු වාර්තාව අනුව පොත් සංසරණ ප්‍රස්තාරයේ සංයුක්ත තැටි විෂයයන් අනුව බෙදීගිය ආකාරය මෙවර ප්‍රස්තාරයේ සඳහන් නොවන බව කමිටු සාමාජික පිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා පෙන්වා දුන්නේය. මේ ගැන නව පුස්තකාලයාධිපතිනිය නොදන්නා බවත් මෙම කමිටුවට පෙර සිටි පුස්තකාලයාධිපතිනිය ස්ථාන මාරු ලැබ ගොස් ඇති බවත් එතුමිය ප්‍රකාශ කළාය. එම නිසා ලබන කමිටුවට එය නිවැරදි කර ඉදිරිපත් කරන බව පුස්තකාලයාධිපතිනිය කියා සිටියාය.

■ බැහැර දෙන අංශය පරිගණක ගත කොට නොමැති බැවින් විද්‍යුත් පුස්තකාලය පමණක් පරිගණක ගත කිරීමෙන් ඵලදායිතාවක් නැති බව කමිටු සාමාජික පිනේන්ද්‍රවංශ මහතා පෙන්වා දුන්නේය. මේ සඳහා පුස්තකාල සේවා මණ්ඩලයේ පුස්තකාල සහායිකාවන්ට පුහුණුව ලබා ගත හැකි බවද තව දුරටත් පෙන්වා දුන්නේය.

■ පිනේන්ද්‍රවංශ මහතා විසින් පොත් පරිගණකගත කිරීම සම්බන්ධව කමිටුව අදහස් ප්‍රකාශ කල අවස්ථාවේ පුස්තකාල සාහායිකා පියන්ති මෙනෙවිය කියා සිටියේ කැළණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ ඉගැන්වීම් කරන ටිකිරි බණ්ඩාර මහතා පුස්තකාලය බැලීමට පැමිණි අවස්ථාවේදී පුස්තකාලයේ පොත් පරිගණක ගත කිරීම ගැන විමසන ලද බවයි. සෑම පුස්තකාලයකම කැළණිය විශ්වවිද්‍යාලයේ පාඨමාලාව භාවිතා කිරීම සුදුසු බවත් එය දිවයිනේ සෑම පුස්තකාලයකම භාවිතා කිරීම සඳහා කටයුතු කරන බවත් එය නොමිලේ අප පුස්තකාලයට ලබා ගත හැකි බවත් පැවසීය. එම පුහුණුව ලබාගෙන පරිගණකගත කිරීමට කටයුතු කරන ලෙස ගරු උපසභාපතිතුමා පැවසිය.

■ කමිටු සාමාජික ඩන්කන් මහතා කියා සිටියේ ආපන ශාලාවේ මහතුන් විසින් පුස්තකාලයේ පිටුපස කාණු තුළ ඉදුල් දමා අපවිත්‍ර කර ඇති බවයි. ගියවර කමිටුවේදී සෞඛ්‍ය පරීක්ෂක මහතා දැනුවත් කොට නිසි පියවර ගන්නා ලෙස පුස්තකාලයාධිපතිනියට උපදෙස් දුන්නේය. එහෙත් එය සිදුවී නොමැති බව එතුමා ප්‍රකාශ කළේය. ඒ විගස ගරු උපසභාපතිතුමා සෞඛ්‍ය පරීක්ෂක මහතා කැඳවා ඒ ගැන විස්තර විමසූ අතර මේ දක්වා එම මහතාට ඒ බැව් දැනුම් නොදුන් බව ප්‍රකාශ කළේය. එතුමා ඒ මොහොතේම ක්‍රියාත්මක වී ආපනශාලාවේ සේවය කරන අයට පිරිසිදු කිරීම ගැන උපදෙස් දෙන ලදී.

■ දෙවැනි ශ්‍රේණි පුස්තකාලයක් තුළ සඟරා 10ක් තිබිය යුතු බව ගියවර කමිටු රැස්වීමේදී පිනේන්ද්‍රවංශ මහතා පෙන්වා දුන්නේය. ඒ අනුව සඟරා 03ක් දැනට ප්‍රධාන පුස්තකාලයේ පරිහරණය වන බවත් පුස්තකාලයාධිපතිනිය ප්‍රකාශ කළාය. එතුමිය ඉදිරිපත් කරන ලද සඟරා නම් ලැයිස්තුව අනුව අනෙක් සඟරා 7ක් පුවත්පත් මිලදී ගන්නා ආයතනයෙන්ම ලබා ගැනීමට කටයුතු කරන ලෙස ගරු උපසභාපතිතුමා දන්වා සිටියේය.

■ කෙරමිණිය ශාඛා පුස්තකාලයේ සාමාජිකයන් වැඩි අතර හිරේවත්ත ශාඛා පුස්තකාලයේ පොත් ප්‍රමාණය ගැන සලකා බලන විට එම ශාඛාවට පොත් අඩු බවද එතුමා විසින් පෙන්වා දෙන ලදී. හිරේවත්ත ශාඛා පුස්තකාලයේ භාවිතා නොවන පොත් කිහිපයක් කෙරමිණි ශාඛාවට ලබා දීමට කටයුතු කරන ලෙස පුස්තකාලයාධිපතිනියට පැවසීය.ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය කියා සිටියේ සුනාමි ව්‍යසනයට පොත් විනාශ වීම නිසා හිරේවත්ත පුස්තකාලයට නොමිලේ ලැබුණු පොත් එම පරිග්‍රහණ පොත් තුලින් බැහැර කිරීමට අපහසු බවයි.

■ පාඨක අදහස් පොත් ගරු උපසභාපතිතුමා බැලීමෙන් පසු කෙරමිණිය, ඕකන්ද පුස්තකාලවලට ඉල්ලා ඇති පොත් එම ශාඛාවට ලැබීමට කටයුතු කරන ලෙස උපසභාපතිතුමා පුස්තකාලයාධිපතිනියට පැවසීය.

■ මෙම අවස්ථාවේදී කමිටු සාමාජික පිනේනද්‍රවංශ ද සිල්වා මහතා විද්‍යුත් පුස්තකාලයට නොමිලේ සංයුක්ත තැටියක් (තාරකා විද්‍යාඥයෝ) ගරු උපසභාපතිතුමා වෙත පිළිගැන්වුයේය. කවදත් නොමිලේ පොත් පුස්තකාලයට පරිත්‍යාග කරන එතුමාට කමිටු නිලධාරී මහතුන් හා ගරු උපසභාපතිතුමා ස්තූතිය ප්‍රකාශ කළහ.

■ පාඨක අදහස් පොත් තුළ අඩුපාඩු පාඨකයා ලියා නොමැති නම් එම ශාඛා භාර නිලධාරීන්ගේ අදහස් එහි සඳහන් කිරීම කළයුතු බව කමිටු සාමාජික ධන්කන් මහතා ප්‍රකාශ කළේය. පාඨක අදහස් පොත් තිබෙන්නේ නිලධාරීන්ට ලිවීමට නොව පාඨකයාට එම ශාඛාවේ අඩුපාඩු ලිවීමට බව කමිටු සාමාජික අනෙක් මහත්වරු ප්‍රකාශ කළහ. පුස්තකාල කමිටුවේදී පුස්තකාල නිලධාරීන්ට දොස්කීම ගැන ගරු උපසභාපතිතුමා ධන්කන් මහතාට දොස් පැවසූ අතර කමිටු සාමාජිකයන්ට නිලධාරීන් අවතක්සේරු නොකිරීමට වග බලා ගත යුතු බව ද පෙන්වා දෙන ලදී.

■ ඕකන්ද ශාඛාවේ සේවය කරන මාලති මහත්මිය කියා සිටියේ මීට මාස කීපයකට උඩදී නාම පුවරුවක් ඉල්ලා ඇතත් එය තවම නොලැබුණු බවයි. එය ප්‍රමාද වන්නේ භාෂා තුනෙන්ම නම් කිරීම සඳහා දෙමළ භාෂාව පිළිබඳ ප්‍රශ්නය නිසා බැව් ප්‍රජා සංවර්ධන නිලධාරි තුමිය පැවසුවාය. ගරු උපසභාපතිතුමා කියා සිටියේ අවශ්‍ය ඕනෑම අවස්ථාවක එම කටයුත්ත නිම කිරිමට දන්නා පුද්ගලයකු උපසභාපතිතුමාට ඉදිරිපත් කිරීමට හැකි බවයි. ප්‍රජා සංවර්ධන නිලධාරි තුමිය ඒ ගැන පියවර ගන්නා බව ප්‍රකාශ කළාය.

■ මෙම අවස්ථාවේදී ආදේශක වශයෙන් සේවය කරන ලද නිලධාරින් 5 දෙනකු ස්ථිර කිරීමේ සතුට පදනම් කරගෙන පුස්තකාලයට පැමිණි නව පුස්තකාලයාධිපතිනිය සමග එකතුව රසකැවිලි සමග තේ පැන් සංග්‍රහයක් පැවැත්වූහ. එයට ගරු උපසභාපතිතුමා ඇතුළු සෑම දෙනාම ස්තූතිය ප්‍රකාශ කළේය.

■ වෙනත් කරුණු ඉදිරිපත් නොවු බැවින් ස්තුති කථාව සඳහා ලේකම් මහතාට උපසභාපතිතුමා ආරාධනා කළේය. එහිදි එතුමා ස්වෙච්ඡාවෙන් කමිටුවට පැමිණි ගරු උපසභාපතිතුමා, කමිටු සමාජික මහතුන් ඇතුළු පුස්තකාලයාධිපතිනිය හා කාර්ය මණ්ඩලයට ස්තූතිය ප්‍රකාශ කරමින් කමිටුවේ වැඩ අවසන් කළේය.

ඒ අනුව **2014 -01- 22** දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**6: 4** **2014- 01- 28** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද සංවර්ධන උපදේශක කාරක සභා රැස්වීම් වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2014 -01- 28 දින පවත්වන ලද සංවර්ධන උපදේශක කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.**

**6: 5** **2014- 01- 30** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කළමනාකරණ කමටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**අම්බලන්ගොඩ නගර සභාව**

**කළමනාකරණ කමිටු වාර්තාව**

**දිනය** : **2014.01.30**
**ස්ථානය** : **නගර සභාව, අම්බලන්ගොඩ**
**වේලාව** : **ප.ව. 02.30**
**සහභාගීත්වය** :

| | |
|---|---|
| **භාරත සමරසේකර මයා** | **- ලේකම්** |
| **එම්. ඩබ්. සිසිර කුමාර මයා** | **- කර්මාන්ත අධිකාරී** |
| **පි එස් එස් ද සිල්වා මයා** | **- මහජන සෞඛ්‍ය පරීක්ෂක** |
| **ශාන්ති ඩී. රාමනායක මිය** | **- ප්‍රධාන කළමනාකරණ සහකාර** |
| **එස් නිර්මලා ද සිල්වා මිය** | **- ප්‍රධාන කළමනාකරණ සහකාර ආදායම්** |
| **කේ. සී. සී. ප්‍රනාන්දු මිය** | **- අභ්‍යන්තර විගණන නිලධාරී** |
| **කේ. ඩබ්. අර්. මානෙල් මිය** | **- පුස්තකාලයාධිපති** |
| **පි එම් ටි විමලධර්ම මෙනවිය** | **- සංවර්ධන සහකාර** |

**01. පිළිගැනීම.**

❖ සියලුම නිලධාරීන් පිළිගන්නා අතර ප්‍රථමව කාර්ය සාධන පිළිබදව අවදානය යොමු කිරිම වැදගත්වේ. මමත් මෙම ආයතනයට අලුත් නිසා මේ පිළිබදවබ කතා කිරිමට සුදුසු පුද්ගලයා ලෙස ආයතනයේ ප්‍රධාන කළමනාකරණ සහකාර රාමනායක මියට පවරන ලදි. - **ලේකම්**

2012 වර්ෂයෙ කාර්ය සාධන ලකුණු මට්ටම මේ වන විට ලැබී ඇති බවත් 2011 වර්ෂයේ දී කාර්යසාධන ලකුණු මට්ටම 314.5 ක් බවත් 2012 වර්ෂයේ දී 298.5 ක් දක්වා අඩු වී ඇති බවත් ඒ අනුව මේ වනවිට ආයතනය හිටපු ලකුණු මට්ටම් වලට වඩා අඩු වි ඇති බව දැකිය හැකිය. එමෙන්ම අඩු පාඩු තිබෙන විෂයය කොටස් දැකිය හැකි බවත් ඒවායේ අඩුපාඩු පවතිනුයේ නිසි පරිදි ලිපි ගොනු ආදී ලේඛන නඩත්තු නොකිරිම මත පමණක් බවත්, ප්‍රජා සේවා, පුස්තකාල හා කර්මාන්ත ආදි අංශ නිදසුන් ලෙස පෙන්වා දිය හැකිය. ඒ අනුව 2013 වර්ෂයේ දී මෙම ලකුණු මට්ටමට ඉහළනන්වා ගැනිම සදහා මෙම අඩු පාඩු ඉවත් කර ගැනිම සදහා ලිපි ගොනු යාවත් කාලින කළයුතු බවය. මේ සදහා ආයතනයේ සියලු නිලධාරීන්ගේ වගකිමෙන් හා කැපවීමෙන් කටයුතු කළ යුතු බවත් 2013 වර්ෂයේදී සියලු ලිපි ගොනු වල අඩුපාඩු සකස් කර අවසන් කර තිබිය යුතු බවත් පවසා සිටින ලදි. **- ප්‍රධාන කළ: සහකාර**

❖ අයතනය වටා තිබෙන ඉවතලන භාණ්ඩ වෙන්දෙසියක් මගින් ඉවත් කර පරිසරය පිරිසිදුව හා පිළිවලකට පත්කිරිමට කඩිනමින් ක්‍රියා කළ යුතු බවත් හා සියලු දෙනාගේම ලිපි ගොනු යාවත් කාලින කර තමා සතු ලිපිගොනුවල නම හා අංකය යොදා සකස් කර තිබිය යුතු අතර එම ලිපි ගොනුවල නාම ලේඛනයක් සකස් කර යුතුය. අනතුරුව තමා සතු කබඩ් එකේ ලිපි ගොනු වල මෙම නාම් ලේඛනයක ඇලවිය යුතුය. එහිදි සියලු දෙනාගේ පහසුවට හා පිළිවලට වැදගත් වේ. තවද ගැටලු සම්බන්ධයෙන් පොතක් දැමිය යුතු බවත් එම පොතට එදිනෙදා කාර්යාලයට එන ගැටලු ලිවිමත් හා විසදුම් ලබා දි එම විසදුම ද ලිවිම සිදුකළ යුතුය. - **ලේකම්**

❖ ප්‍රජා අංශයට ලකුණු අඩුවීමට හේතු වුයේ එම විෂය කළ වාසනා මිය නිවාඩු යාමත් ඒ සඳහා යොමුකළ පුෂ්පා මිය එම ලිපි ගොනු පිළිබඳව නොදැන සිටීමත් නිසා බවය. පුස්තකාලයට ගිය එම නිළධාරින් සෑහිමකට පත් වුවද ලකුණු ලබාදීම පිළිබඳව සෑහිමකට පත්විය නොහැක. ගාල්ලේ පුස්තකාලයට වඩා අපේ පුස්තකාලය ඉහළින් සිටින බවත් අපේ පොත් බැදීම ඉහළ තත්වයක තිබෙන බවද පවසා සිටින ලදී.

-**අභ්‍යන්තර විගණන නිලධාරී**

**ආයතන අංශය පිළිබඳව සාකච්ඡා කිරීම**

❖ අප අංශයේ ගැටලුවක් නොමැති බවත් සාර්ථකව කටයුතු කරගේන යන බවත් මේ දවස්වල කාර්ය සාධනයට සුදානම්ව කටයුතු කරමින් පවතින බව. - **ප්‍රධාන කළ: සහකාර**

**ආදායම් අංශය පිළිබඳව සාකච්ඡා කිරීම**

❖ ලිපි ගොනු පවත්වාගෙන යාමට කබඩ් එකක් අවශ්‍ය බවත් එම කබඩ් එක නිසියාකාරව කාර්යාලය තුළ තබා ගැනිමට තැනක් අවශ්‍යය. මෙම ගැටලුවට පිලියමක් අවශ්‍ය බව හා වෙළද පොළ භාරකාර සිල්වා මයා තම රාජකාරි වේලාවන්හි හිග මුදල් එකතු කිරිමට යාම ගැටලුවක් බවත්, සිතාර මයා හිග මුදල් එකතු කිරිමට යාමට අවසර ඉල්ලා ඇත. -**ප්‍රධාන කළ: සහකාර ආදායම්**

❖ රාජකාරි වේලාවන්හි සිල්වා මයා හිග මුදල් එකතු කිරිමට යාම ගැටලුවක් වුවද මුදල් ලබා ගැනිම සඳහා එය අවශ්‍ය තත්වයකට පත්ව ඇති බවත් ලැබෙන කොමිස් මුදල නිසා මෙවැනි වාතාවරනයක් උත්ගතවි ඇති බවය. සිතාර මයාට හිග මුදල් එකතු කිරිමට යාම ගැටලුවක් නොවන බැවින් ඔහුට ඒ සඳහා යොමුවිය හැකිය.

- **ප්‍රධාන කළ: සහකාර**

❖ හිග මුදල් එකතු කිරිමට යාමේ දි ඔවුනට ඉලක්කයක් ලබා දි එම ඉලක්කය සපුරන්නේනම් පමණක් ඔවුන්ට යම් කොමිස් මුදලක් ලබා දිමට කටයුතු කිරිම වරදක් නොවේ.

- **ලේකම්**

❖ ඩම්පින් යාඩ් එක තුනිකර අවසන්ය. එම කාර්ය සාර්ථකව ඉටුකර ගැනිමට හැකි විය. D4E යන්ත්‍රය (පස් තුනිකතරන යන්ත්‍රය) අවශ්‍ය බවත්, පිරිස් වෙද මාවතේ ඇළ සුද්ද කිරිමට හා කොරියට වැලි පැටවිමට අවශ්‍ය J C B යන්ත්‍රය අවශ්‍ය බැවින් එය අනුමත කර ගැනිමට අවශ්‍යකරන ලිපි ලේඛන ලබා දුන්නද තවම ඒ පිළිබඳව කිසිදු අනුමැතියක් ලැබි නොමැත. යාඩ් එකට අවශ්‍ය රතු පස් බෝරළු ලබා ගැනිම සඳහා ද කටයුතු කළ යුතුය. අනුමැතියකින් තොරව කටයුතු කිරිමට මා හට කිසිදු අයිතියක් නොමැති බැවින් මාහට අයත් රාජකාරි ඉටු කිරිම සඳහා අවශ්‍ය අනුමැතිය ලබාදිමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටින ලදී

-**මහජන සෞඛ්‍ය පරීක්ෂක**

❖ J C B යන්ත්‍රය ලබා ගැනිමේදි පැයකට රුපියල් 2000 කට වඩා යන බවත් මෙහිදි මිළ ගණන්වල යම් යම් ප්‍රශ්න පවතින බව සැබැ වුවද මෙම ප්‍රශ්නයට විසදුමක් කඩිනමින් ලබා ගත යුතු බවය.

-**වැඩ අධිකාරි**

❖ ඇළ සුද්ද කිරිමට හා J C B යන්ත්‍රය ලබා ගැනිමට අවශ්‍ය අනුමතිය ලබා දි ඇත. එම ලිපි කා අතට පත් වුවේද යන්න සේව්‍ය යුතුය රතු පස් බෝරළු ලබා ගැනිම අවශ්‍ය මිළ ගනන් කැදවිම කළ යුතු බැවින් ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු කිරිමට සැපයුම් අංශයට යොමු කරන්න. - **ලේකම්**

**කර්මාන්ත අංශය පිළිබඳව සාකච්ඡා කිරීම**

❖ මන්ත්‍රිවරුන්ගේ නාම පුවරුව සකස් කළේද යන්න විමසන ලදී.

- **ලේකම්**

❖ මන්ත්‍රීවරුන්ගේ නාම පුවරුව සකස්කිරීම සඳහා දින වකවානු නිවැරදි ලෙස මා හට නොමැති බැවින් එ සඳහා කටයුතු කිරීමට අවශ්‍ය නම් හා දින වකවානු නිවැරදිව සටහන් කර ලිඛිතව ලබා දුන් පසු එය සම්බන්දයෙන් කටයුතු කිරීමට හැකිය. මාර්ග ලේඛනය තවමත් අවසන් කර නොමැත කාර්ය සාධනයට සුදානම් විය යුතු නිසාත් ලකුණු ලබා ගැනිමට නම් මෙම ලිපි ගොනු සකස් කර තිබිම වැදගත්ය. මෙම ලිපි ගොනු කඩිනමින් සකස් කරන ලෙසට නිශාන්ති මියට හා ගයත්‍රි මියට ලිපියක් මගින් දැනුම් දෙන ලෙසත්, එහිදී මාර්ග ලේඛනය, පුද්ගලික මාර්ග ලේඛනය හා විදුලි පහන් ලේඛනය යන ලේඛන තුන පිළිබදවම දැනුවත් කරන්න. **-කර්මාන්ත අධිකාරී**

❖ මන්ත්‍රීවරුන්ගේ නාම පුවරුවට අවශ්‍ය නම් හා දින වකවානු ලිඛිතව ලබා දීම සඳහා පුෂ්පකුමාර මයාට භාර දෙන්න. **-ප්‍රධාන කළ: සහකාර**

**පුස්තකාල අංශය පිළිබදව සාකච්ජා කිරීම**

❖ පසුගිය අවුරුද්දේ එනම් 2012 හි කාර්ය සාධනයේ ලකුණු අඩුවිමට හේතු වූ කියවිම් ශාලාවක් වෙන් නොකිරම නිසාය. මෙම තත්වයට විසදුමක් ලෙස දැනට විමර්ශන අංශයෙම එක් කොටසක කියවිම් ශාලාව ලෙස බෝඩ් එකක් සවි කර කියවිම ශාලාවක් සකස් කිරිමට සුදානම් කර ඇත. එවිට 2013 වර්ෂය සඳහා එම ලකුණු නැවත ලබාගැනිමට හැකි වේ. **- පුස්තකාලයාධිපති**

**02. රැස්විමේ වැඩ කටයුතු අවසන් කිරිම.**

- ❖ ස්තුති කථාව කිරිම සහ රැස්විමේ වැඩ කටයුතු අවසන් කිරිම. **- ප්‍රධාන කළ: සහකාර**

- ❖ සකස් කළේ : පි.එම්.ටි. විමලධර්ම (සංවර්ධන සහකාර)

**ඒ අනුව 2014 -01- 30 දින පවත්වන ලද කළමනාකරණ කමටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

- **පෙ ව 10.45 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. හාෂිනී මේනුකා විජේසූරිය මිය සභාවට පැමිණෙන ලදි.**

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙම අවස්ථාවේදී අභිනවයෙන් පත්වී සිටින මන්ත්‍රීතුමිය පැමිණ තිබෙනවා. එතුමියට දිව්රුම් දීමේ කටයුතු සිදු කිරීමට අවස්ථාව සලසා දෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. හාෂිනී මේනුකා විජේසූරිය මහත්මිය ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා ඉදිරියේ දිව්රුම් දීමේ කටයුතු සිදු කරන ලදි.**

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙම අවස්ථාවේදී ජේ. ඩබ්. හාෂිනී මේනුකා විජේසූරිය මහත්මිය නගර සභා මන්ත්‍රීධුරයේ නිසි ලෙස දිව්රුම් දීමේ කටයුතු සිදු කරනු ලැබූ බව ප්‍රකාශ කර සිටිනවා. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරයෙකු වශයෙන් පත්වෙලා ඉදිරියේදී කටයුතු කරන්න ලැබීම සම්බන්ධව අපගේ සුභාසිංශන මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. පසුගිය පළාත් පාලන මැතිවරණයේදී අප පක්ෂය වෙනුවෙන් වෙහෙස මහන්සි වී වැඩ කරල පක්ෂය දිනවීමට ලොකු කැපවීමක් දක්වපු

සාමාජිකාවක්. අපේ හිටපු නාගරික මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතාගේ ඉල්ලා අස්වීම අනුව එම පුරප්පාඩුව සඳහා පත්වෙලා අපේ නගරයේ ජනතාවට සේවය කරන්න අවස්ථාව ලැබීම සම්බන්ධයෙන් අම්බලන්ගොඩ නගර සභාවේ සභාපතිවරයා ලෙස මගේ පෞද්ගලික සුභාසිංශනයත් ඒවගේම නගරයේ ජනතාව වෙත කලහැකි උපරිම සේවාව කිරීම සඳහා ශක්තිය ධෛර්ය වාසනාව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමනි නගර සභාවට අභිනවයෙන් තේරී පත්වූ ජුවන් වඩු හාෂිනී මේනුකා මහත්මියට විපක්ෂ කණ්ඩායමේ සුභ පැතුම් එක් කරනවා. රාහුල මහත්මාගේ පුරප්පාඩුව සඳහා මැතිවරණයෙන් ලද ජන්ද ප්‍රමාණය අනුව මැතිවරණ ක්‍රමය අනුව තමයි මේ මහත්මිය තේරී පත්වී ඇවිල්ල තියෙන්නෙ. එතුමියට නගර සභාවේ කාර්යභාරය කරගෙන යෑමට ධෛර්ය ශක්තිය ලැබෙන්න කියල ප්‍රාර්ථනා කරනවා. විශේෂයෙන්ම මම සන්තෝස වෙනවා අපේම කෙනෙක් ජුවන් වඩු කෙනෙක් පත්වීඹ සම්බන්ධව. මම මේ අවස්ථාවේදි එතුමියට ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් කලහැකි යුතුකම් සභාපතිවරයාගේ සහ ලේකම්වරයාගේ සහයෝගය ලබාගෙන හොඳින් ඉටු කිරීමට වාසනාව ලැබේවා කියමින් මේ අවස්ථාවේ විපක්ෂ කණ්ඩායමේ සුබ පැතුම් එක් කරනවා.

- පෙ. ව. 10.55 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා සභාවට පැමිණෙන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

සභාපතිතුමනි මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කල රාහුල ලලිතවික්‍රම මහතාගේ ඉල්ලා අස්වීම මත අද දින නව මන්ත්‍රීතුමිය තේරී පත්වී පැමිණිලා තියෙනවා. ප්‍රථමයෙන්ම මාගේ සුභාසිංශනත් අම්බලන්ගොඩ ප්‍රගතිශීලි ජනතාවගේ සුභාසිංශනත් මේ අවස්ථාවේදි පුද කර සිටිනවා. ප්‍රගතිශීලි දේශපාලන පවුලකින් පැමිණි මෙතුමිය සහ මෙතුමියගේ පවුලේ අය පසුගිය වකවානුව තුල රටේ පැවති තීරණාත්මක මැතිවරණ වලදී පෙරමුණ ගෙන කටයුතු කරනු ලැබුවා. ජුවන් වඩු පරම්පරාවේ උරුමක්කාරියක් විදියට එතුමියගේ මේ පුනරාගමනය මෙතුමිය සැබෑ සනිටුහනක් තබාවී කියා විශ්වාස කරනවා. සුවිශේෂී සමාජ මෙහෙවරක් කිරීමට අවශ්‍ය වටපිටාව ඔබතුමාගෙ නායකත්වය සහ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ආශිර්වාදය යටතේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන ඉදිරි දැක්ම වැඩ පිළිවෙල ඉදිරියට ගෙන යන්නට ශක්තිය ධෛර්ය නිරන්තරයෙන් ලැබෙන්න කියල අපි ප්‍රාර්ථනා කරනවා. ඒවගේම මෙතෙක් කාලයක් එක් මන්ත්‍රීවරියක් පමණක් මේ සභාව නියෝජනය කරනු ලැබුවා. නමුත් දැන් මන්ත්‍රීවරියන් දෙනෙනෙක් මේ සභාව නියෝජනය කිරීමත් විශේෂ කරුණක්. ඒ සම්බන්ධව ස්තුතිය පුද කරමින් එතුමියට දීර්ඝ ගමනකට ආශිර්වාද පතමින් නිහඩ වෙනවා. ස්තුතියි.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි අම්බලන්ගොඩ නගර සභාවට අලුතින් මන්ත්‍රීවරියක් වශයෙන් තේරී පත්වෙලා අද දින දිව්රුම් දුන් හාෂිනී විජේසූරිය මන්ත්‍රීතුමියට අපේ සුභ පැතුම් සහ අම්බලන්ගොඩ ජනතාවගේ සුබ පැතුම් එක් කරනවා. ඒවගේම දීර්ඝ කාලයක් මේ සභාව නියෝජනය කරේ එක් මන්ත්‍රීවරියක් පමණයි. නමුත් අද දින සිට අපි දෙළොස්දෙනා අතරෙ කාන්තා නියෝජනයන් දෙකක් වෙනවා. ඇත්තටම අපි සතුටු වෙනවා අම්බලන්ගොඩ ජනතාවට සේවය කිරීමට එතුමිය ඉදිරිපත් වීම සම්බන්ධව. එතුමියට දීර්ඝ කාලයක් නගරයේ ජනතාවට සේවය කිරීමට ශක්තිය ධෛර්ය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් නිහඩ වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි අද දින විශේෂිත  දිනයක් වෙනවා. 2011 පැවති පළාත් පාලන මැතිවරණයේදී සුලු ප්‍රමාණයක් මනාප අඩුවෙලා අද දිනයේ රාහුල ලලිතවික්‍රම මහතාගේ ඉල්ලා අස්වීම අනුව භාෂිනී මේනුකා විජේසූරිය මැතිණිය මන්ත්‍රීවරියක් වශයෙන් මේ සභාවෙ දිව්රුම් දීම වෙනුවෙන් අපි ඇයට සුභ පතනවා. දේශපාලනයට සුදුසු පවුල් පසුබිමකින් මෙම ස්ථානයට පත්වෙලා ඒම පිළිබඳව විශේෂයෙන්ම මම සතුටු වෙනවා. මොකද අද දිනයේ ජනතාවට සේවය කිරීමේදී ඒ සඳහා ආර්ථික වශයෙන් යම් හැකියාවක් තිබීමත් වැදගත් වෙනවා. ඒ හැකියාව මෙතුමියගේ පවුල් පසුබිම තුල තිබෙනවා. නවක මන්ත්‍රීවරියක් විදියට ඇයට අපේ සහයෝගය ඉදිරියේදී ලබා දෙන බවට මෙහිදී සතුටින් ප්‍රකාශ කරනවා. ඒවගේම මම කියන්න කැමතියි නෑකමට ගත්තොත් මෙතුමිය මගේ භාර්යාවගේ මවගේ සහෝදරියගේ දුවගේ දුව. ඒ අනුවත් ඇයව ආරක්‍ෂා කිරීමේ වකගීමක් මට තිබෙනවා. ඇයට දිගු කාලයක් අම්බලන්ගොඩ ජනතාවට සේවය කිරීමට වාසනාව ලැබේවායි පතමින් නිහඬ වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**

සභාපතිතුමනි රාහුල ලලිතවික්‍රම මන්ත්‍රීතුමාගෙ ඉල්ලා අස්වීම අනුව ඇතිවූ පුරප්පාඩුව මත අද දින මන්ත්‍රීධුරයේ දිවුරුම් දෙනු ලැබුවා. එතුමියට ඉදිරියේදී දේශපාලන කටයුතු සාර්ථකව කරගෙන යාමට ශක්තිය ධෛර්ය ලැබේවායි පතමින් ඇයට සුබ  පතමින් මම නිහඬ වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි කාන්තා නියෝජනයේ පිබිදීමක් ඇති කරමින් අද දින දිව්රුම් දුන් භාෂිනී මේනුකා විජේසූරිය මැතිණියට කෙරම්ණිය පින්නදුව ජනතාවගේ සුබ පැතුම් එක් කරමින් ඇයගේ ඉදිරි කටයුතු සාර්ථක වේවායි පතමින් අපි නවතිනවා. ස්තුතියි.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

සභාපතිතුමනි නව මන්ත්‍රීවරියක් වශයෙන් දිවුරුම් දුන් ජුවන්වඩු භාෂිනී මේනුකා විජේසූරිය මහත්මියට මාගේ සුභාසිංශන පුද ර සිටිනවා. අම්බලන්ගොඩ ප්‍රදේශය යම් යම් කරුණු පදනම් කරගෙන ප්‍රසිද්ධියට පත් වෙලා තියෙනවා. කලා භූෂණ සම්මාන දිනාගත් ජනාධිපති සම්මාන ලාභී ජුවන්වඩු ආරියපාල මැතිතුමාගේ පෙළපත මිණිබිරියක් හැටියට ඉදිරියට ගෙනයාමට අද දින මන්ත්‍රීවරියක් හැටියට දිව්රුම් දීල එතුමිය බලාපොරොත්තු වෙනවා. අපි බන්දු විජේසූරි ආයතනයේ කෝලම් කලාව ප්‍රගුණ කරන අවදියේදී අපි දැක්කෙ මෙතුමිය කුඩා දියණියක් විදියට. ඉතින් අපි සතුටු වෙන්න ඕනෙ එවන් දියණියක් අම්බලන්ගොඩ ජනතාවට සේවය කරන්න ඉදිරිපත් වීම සම්බන්ධව. මම එතුමියට අම්බලන්ගොඩ ජනතාවට සේවය කිරීම තුලින් හොඳ සමාජ සේවිකාවක් විදියට ඉදිරියට යාමට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් එක්සත් ජාතික පක්‍ෂයේ අම්බලන්ගොඩ සංවිධායකවරයා වශයෙන් පක්‍ෂයේ සුබ පැතුම්ද එක් කරමින් නිහඬ වෙනවා.

- පෙ. ව. 11.30 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්‍ෂම් හේමන්තා ද සිල්වා මෙනවිය සභාවට පැමිණෙන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි ප්‍රථමයෙන්ම මම නව මන්ත්‍රීධුරයේ දිව්රුම් දුන් භාෂිනී මේනුකා විජේසූරිය මහත්මියට සුබ පැතුම් එක් කරනවා. මේ සභාවෙ සියලුම මන්ත්‍රීවරුන් එතුමියට සුබ පැතුම් එක්කරනු ලැබුවා. මේ නගරයට සේවයක් කිරීමට ඇයට ශක්තිය ධෛර්ය ලැබේවායි පතමින් මම නිහඬ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අද දින භාෂිනී මේනුකා විජේසූරිය මහත්මිය මන්ත්‍රීධූරයේ දිව්රුම් දීම සම්බන්ධව මම සතුටට පත් වෙනවා. මොකද එතුමිය අපේ හිතවත් සහෝදරයෙකුගේ දියණියක්. ඒවගේම මම බලාපොරොත් වෙනවා එතුමිය ඉදිරියේදී තමුන්නාන්සේලාට හොද සේවයක් සපයාවි කියලා. එතුමියට සුභාසිංශනය කරමින් මම නිහඩ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ ඩබ්. භාෂිනී මේනුකා විරේසූරිය මහත්මිය කතා කරමින්</u>**

සභාපතිතුමා, උප සභාපතිතුමා, විපක්ෂනායකතුමා ඇතුලු මන්ත්‍රී මඩුල්ලෙන්ම අවසරයි. මට අද දින ලිපිය හම්බවුනේ හදිස්සියෙන්ම. පළමුවෙන්ම මෙවැනි මන්ත්‍රී මඩුල්ලක් සමග වැඩ කිරීමට ලැබීම ගැන මම ඉතාමත් සතුටු වෙනවා. මම හිතන්නෙ මෙතන වැඩි දෙනෙක් මගේ ඥාතීන් එහෙම නැත්තම් මගේ පවුල සමග සම්බන්ධතා ඇති මට ලෙන්ගතු අය. අම්බලන්ගොඩ නගරයේ ඉදිරි වැඩ කටයුතු කිරීමට පක්ෂයේත් විපක්ෂයේත් සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය මට ලැබේවි කියල මම බලාපොරොත්තු වෙනවා.  ස්තුතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි, උප සභාපතිතුමනි, විපක්ෂනායකතුමා ඇතුලු සියලුම මන්ත්‍රීවරුනි, කාර්ය මණ්ඩලයේ මහත්ම මහත්මීනි, මාධ්‍යවේදී මහතුනි. 2002 වසරේ සිට අම්බලන්ගොඩ නගර සභාවේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙකු වශයෙන් මම පත් කිරීඹ සම්බන්ධයෙන් අම්බලන්ගොඩ නගර සභා සීමාව තුල ජීවත් වන ජනතාවට මගේ ප්‍රණාමය මේ අවස්ථාවේදී පුද කරනවා. එම කාලය තුල මා පත්කර ජනතාවට කල හැකි උපරිම සේවයක් මම කරා. ඒවගේම තිස් වසරක් පුරා පැවති යුද්ධය නිමා කරන්නට තම ජීවිතය පරිත්‍යාග කරපු අම්බලන්ගොඩ ආසනයේ උපන් මගේ හිතවත් වීර සෙන්පති ජෙනරාල් සරත් ෆොන්සේකා මහතා රට මුදා ගැනීමේ දෙවනි මෙහෙයුම ආරම්භ කරල තියෙනවා. ඒ අවස්ථාවෙදි ඒ මහතා සමග එකතු වීමට මම තීරණය කරා. එබැවින් මම මෙතෙක් නියෝජනය කර එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත් වී ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට එක්වීමට තීරණය කල අතර ඉදිරි පළාත් සභා මැතිවරණයේදී එම පක්ෂය නියෝජනය කිරීමට අපේක්ෂා කරනවා. මම වසර 11 ක් පමණ මට සහයෝගය දුන් අම්බලන්ගොඩ ජනතාවටත් සභාපතිතුමා ඇතුලු නාගරික මන්ත්‍රීවරුන්ටත් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් ලේකම්තුමා ඇතුලු කාර්ය මණ්ඩලයටත් මගේ හෘදයාංගම ස්තුතිය මේ අවසුථාවේ පුද කරනවා. තවද ඉදිරි පළාත් සභා මැතිවරණයේදී මා සමග තරග වැදීමට නියමිත සභාවේ ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතාටත් මගේ සහෝදර ජනිත් වික්‍රමතිලක මහතාටත් මගේ සුභාසිංශනය පතමින් මම මේ අවස්ථාවේදී නිහඩ වෙනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අද විශේෂ දවසක්. එතුමා 2002 මේ සභාව නියෝජනය කරේ. ප්‍රදේශයට විශාල සේවාවක් කරල නියෝජනය කරන පක්ෂයේ විනය කඩ නොකර ඊළග පළාත් සභාවට තරග කිරීම සඳහා අම්බලන්ගොඩ නගර සභාවෙ මන්ත්‍රීධූරයෙන් ඉල්ලා අස්වීමට තීරණය කරල තියෙනවා. මීටත් වඩා ජනතාවට සේවය කරන්න පුලුවන් ස්ථානයකට තමයි එතුමා යෑමට බලාපොරොත්තු වෙන්නෙ. අපි එතුමාට සුබ පතනවා ඉදිරි පළාත් සභා මැතිවරණය ජයග්‍රහණය කරල අම්බලන්ගොඩ ජනතාවට තවත් සේවය කිරීමට අවස්ථාව ලැබේවා කියල අපිත් සමග සිටිය සහෝදර මන්ත්‍රීවරයෙකු වශයෙන් අපි සුබ පතනවා.  එතුමා ප්‍රකාශ කරා රට මුදාගත් සෙන්පතියා සමග එකතු වෙනවා කියල. මම ප්‍රකාශ කරන්න කැමතියි රට මුදාගත් සෙන්පතියා නම් ඉන්නෙ අපේ පැත්තෙ. එහෙමනම් එකතු වෙන්න ඕනෙ අපිත් එක්ක කියලා. අපේ සේනාධිනායකයා විදියට අතිගරු ජනාධපති මහින්ද රාජපක්ෂ මැතිතුමා තමයි රට මුදා ගත්තෙ. අපිත් සමග වසර ගණනක් ඉදපු අපේ මන්ත්‍රීතුමාට මම නැවත වරක් පළාත් සභාව නියෝජනය කිරීඹට වරම් ලැබේවායි පතමින් නිහඩ වෙනවා. ස්තුතියි.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි අද දිනය විශේෂ දිනයක්. අපිත් සමග එකට වැඩ කරපු මන්ත්‍රීවරයෙක් වෙන්වෙලා යෑම සම්බන්ධව කණගාටුවක් තියෙනවා. එතුමා නික්මිලා යන්නෙ එතුමාගේ දේශපාලන ජීවිතය මීට වඩා උසස් කර ගැනීමේ පරමාර්ථයෙන්. ජනතාවට මීටත් වඩා සේවාවක් සලසන්න එහිදී අවස්ථාව ලැබෙනවා. ඒකත් සතුටට කාරණයක්. එතුමාට ඒ අවස්ථාව උදාවේවා කියල මම ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි ස්වකීය දේශපාලන ජීවිතයේ ජයග්‍රාහී මාවතකට අවතීර්ණව සිටින චන්ද්‍රසිරි මැතිදුන්ගේ ඉදිරි ගමන සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි පතමින් නිහඬ වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමනි කේ. එම්. චන්ද්‍රසිරි මහතා අද දින පක්ෂයෙන් අයින් වෙනව වගේම නගර සභා මන්ත්‍රීධුරයෙනුත් ඉල්ලා අස්වෙනවා. මම මේ අවස්ථාවේදී එතුමා අපේ පක්ෂය වෙනුවෙන් කරපු සේවය අගය කරනවා. අපි අපේ ප්‍රදේශයේ යම් දෙයක් කරද්දී ඒ වෙනුවෙන් දර දිය ඇදල අපිත් එක්ක එකතු වෙලා හොඳ කාර්ය භාරයක් කරපු මන්ත්‍රීවරයෙක්. මම ඇත්තටම කණගාටු වෙනවා එතුමා ඉවත්වීම සම්බන්ධව. මොකද ඒවගේ අය අපට අවශ්‍යයි. අපි ලොකු කාර්යභාරයක් මේ ප්‍රදේශයේ කරන කොට එක්කෙනෙක් නැති වුනහම ඒක අපට ලොකු පාඩුවක්. එතුමා සරත් ෆොන්සේකා මහත්මයත් එක්ක ධර්මාශෝක විද්‍යාලයේ එක පන්තියේ ඉඳල එක ගමේ එකට ජීවත් වෙලා නිසා එතුමාගේ ඉල්ලීම පැහැර හරින්න බැරි වෙන්න ඇති. මට මේ ගැන කියපු වෙලාවෙ මම කිව්ව මට බල කරන්න බැහැ දෙපාරක් හිතන්න කියල. එතුමා පළාත් සභාව නියෝජනය කරන්නයි ඉවත් වෙන්නෙ. නමුත් මම කියන්න ඕනෙ පළාත් සභාවට ගියත් ඔබතුමාලට එකතුවෙන්න වෙන්නෙ එක්සත් ජාතික පක්ෂයත් එක්කයි කියලා. කෙසේ නමුත් ඔබට ඕනෑම වෙලාවක අපේ පක්ෂය විවෘතයි. ඒවගේම . සරත් ෆොන්සේකා මහත්මය තමයි යුද්ධය ජය ගැනීමට ප්‍රායෝගික වශයෙන් සියලුම කටයුතු කරේ. ජනාධිපතිතුමාගෙ සහයෝගය ජනාධිපතිතුමා දුන්නා. රට පාලනය කරන නායකයා වශයෙන්. චන්ද්‍රසිරි මන්ත්‍රීතුමාට නැවත වරක් පවසා සිටිනවා එක්සත් ජාතික පක්ෂයේ දොර විවෘතව පවතින බව. අපට මෙයට විරුද්ධ වෙන්න බැරි කුඩා කල සිටම තිබෙන සම්බන්ධතාව මත එතුමාට මේ ඉල්ලම පැහැර හරින්න බැරි නිසයි මෙහෙම වුනේ. මම මේ අවස්ථාවේදී අපේ සභාපතිතුමා තරග බරනවා පළාත් සභාවට, ජනිත් වික්‍රමතිලක මහත්මා එක්සත් ජාතික පක්ෂයෙන් තරග කරනවා. මෙතුමාත් සමග තුන්දෙනෙක් පළාත් සභාවට තරග කරනවා. මම හිතනවා මේ තුන්දෙනාම පැමිණියොත් අපේ අම්බලන්ගොඩ නගරයට විශාල දායකත්වයක් ගන්න පුලුවන් වේවි කියල. මහ ඇමතිතුමාත් සමග හතර දෙනෙක්ම ඉන්නවා. ඉතින් අපට පක්ෂ භේදයක් නැතිව නගරයට ලොකු වාසියක් ගන්න පුලුවන් බවයි මගේ හැගීම. ඔබ තුන් දෙනාටම පළාත් සභාවට තේරී පත්වීම සඳහා වාසනාව ලැබේවායි මගේ සුබ පැතුම් එක් කරමින් මම නිහඬ වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි අද දින නවක මන්ත්‍රීවරියක් පත්වෙලා ඇවිල්ල ඒ සතුට තියෙන අතරෙ චන්ද්‍රසිරි මන්ත්‍රීතුමා ඉල්ලා අස්වීම සම්බන්ධව කණගාටුවක් තියෙනවා. එතුමා අද ශ්‍රේෂ්ඨ තීරණයක් අරගෙන තියෙනවා. එතුමා මන්ත්‍රීධුරයෙන් ඉවත් වෙලා ඒ අවස්ථාව තවත් කෙනෙකුට ලබා දීල යන්න. එතුමා ගත්ත තීරණයට අපි එතුමාට ගෞරව කරනවා. එතුමා යන්නෙ මීට වඩා උසස් තැනකට තරග කරන්න. පළාත් සභාවට. මන්ත්‍රීතුමනි මම ඔබතුමාට දකුණු පළාත් සභාව තුල ජනතාවගේ හඬ අවධි කරන්නට ඉදිරියේදී අවස්ථාව ලැබෙයි කියල විශ්වාස කරනවා. මම ඔබතුමාට ඒ සඳහා සුභ පැතුම් එක් කරනවා. ඒවගේම ගරු සභාපතිතුමාට ජනිත් වික්‍රමතිලක මන්ත්‍රීතුමාට අපෙන් සමු අරගෙන යන චන්ද්‍රසිරි මන්ත්‍රීතුමාට යන සියලු දෙනාට අම්බලන්ගොඩ ජනතාවගේ හඬ පළාත් සභාව තුල අවධි කරන්නට අවස්ථාව ලැබේවායි ප්‍රාර්ථනා කරමින් ඒ සඳහා සියලු ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

සභාපතිතුමනි අපේ නගර සභාවේ 1991 සිට 1997 දක්වාත් නැවත 2011 සිට මේ දක්වාත් අපිත් සමග සම්පව නගර සභා මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කර කේ. එම්. චන්ද්‍රසිරි මන්ත්‍රීවරයා එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත් වෙලා එතුමාගේ හිතෙෂී එතුමා උපන් දවසේම උපත ලැබූ සරත් ෆොන්සේකා මහතාගේ පක්ෂයෙන් පළාත් සභා මැතිවරණය සඳහා ඉදිරිපත් වීමට සූදානම්ව සිටින මොහොතේ නගර සභාවේ මන්ත්‍රීධුරයෙන් ඉවත් වන බව අද දින දැනුම් දෙනු ලැබුවා. ඒක තමයි ශ්‍රේෂ්ඨ ක්‍රියාව. මම ආසනයේ සංවිධායකවරයා වශයෙන් කිසිම අපහසුතාවයකට පත් කරන්නෙ නැතිව ඒ කටයුත්ත කිරීම සම්බන්ධව මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. අපි කවුරුත් දේශපාලනයට ඇවිල්ල කරන්නෙ සමාජ මෙහෙවරක්. සභාපතිතුමාත් මමත් ඉදිරි පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වීමට අත්සන් කරල ඒ සඳහා ඉදිරිපත් වීමට අපේක්ෂාවෙන් ඉන්නවා. ඒවගේම මෙතුමාගෙත් අරමුණ එතුමාගේ හිතවතාගෙ පක්ෂයට එකතු වෙලා ජනතාවට සේවයක් කිරීමට පළාත් සභාව නියෝජනය කිරීමට යෑම. මම මේ අවස්ථාවේදී එතුමාට සුබ ප්‍රාර්ථනා කරනවා මන්ත්‍රීධුරයක් ලබා ගැනීමට අවස්ථාව ලැබෙවා කියල. අම්බලන්ගොඩ නගර සභාව තුලින් බිහිවෙච්ච ඉහල තලයේ සමාජ සේවකයන් බොහොමයක් ඉන්නවා. අද මේ සභාවෙන් තුන් දෙනෙක්ම පළාත් සභාව නියෝජනය කිරීමට තරග කරනවා. මම දකින්නෙ මේක වැදගත් සභාවක් විදියට. අපි තුන් දෙනාම තේරී පත්වුනොත් අම්බලන්ගොඩ නගරයට ලොකු වාසියක් ලැබෙනවා. ලක්ෂ 50 ක් පළාත් සභා මන්ත්‍රීවරයෙකුට ලැබෙනව. රට අමතරව යම් යම් ප්‍රතිපාදනත් ලැබෙනවා. ඒ සඳහා අපි තිදෙනාටම වාසනාව උදාවේවායි ප්‍රාර්ථන කරනවා. ඒවගේම චන්ද්‍රසිරි මන්ත්‍රීතුමාගේ ඉදිරි දේශපාලන අනාගතය සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමින් නිහඩ වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

සභාපතිතුමනි විපක්ෂය වෙනුවෙන් කාර්ය භාරයක් ඉටු කල චන්ද්‍රසිරි මන්ත්‍රීතුමා අද වින අපේ සභාවෙන් ඉවත් වී යනවා. අපි දේශපාලනයේ ඉන්න අය විදියට එතුමාත් ඉතිහාසයේ සිටම ප්‍රතිවාදීව ඒ සටන් මෙහෙයෙව්වා. පෞද්ගලිකව මට මෙය වේදනාකාරී අවස්ථාවක්. විපක්ෂය වෙනුවෙන් එතුමා දැවැන්ත කාර්ය භාරයක් ප්‍රදේශය තුල ඉටු කලා. යම් අවස්ථාවලදී යම් යම් වචන හුවමාරු සහ රට එහාට ගියපු අවස්ථාවලට මුහුණ දීල තියෙනවා. පහුගිය අවුරුදු කීපය තුල මෙතුමා හොඳ ප්‍රතිවාදියෙක් වුනත් බොහොම ලෙන්ගතු සහෝදරයෙක් විදියට මම මෙතුමාත් සමග ගමේ දේශපාලන කටයුතු සිදු කරා. මෙහිදී මෙතුමාගේ සමුගැනීමට අදාලව නොවුනත් ප්‍රතිඋත්තරයක් දීමක් වශයෙන් මම ප්‍රකාශ කරන්න කැමතියි මෙතුමාගේ අද සිට නායකයා වන ඒ මිත්‍රයාගේ නායකත්වයට මනාපයක් දෙන්න මේ විපක්ෂයේ සියලු මන්ත්‍රීවරු පෙළ ගැහුනා 2010 වර්ෂයේ. ඒ රටේ නායකත්වය ජාත්‍යන්තරයට ගෙනියන්න තමයි මෙතුමාල පෙල ගැහුනේ. ඒ නායකත්වය පිලිගත්ත නම් මේ රටේ ඉන්න සියලු සහෝදරයෝ, මහජනතාව එහෙම වුනානම් ඒ සියලු දෙනාම අද අනාථයි සභාපතිතුමනි. එතුමන්ල අද වෙනත් විකල්ප මාර්ගයක යනවා. ඒ ආකාරයෙන් රටේ නායකත්වයට එතුමාව පිලිගත්ත නම් මම කැතියි අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් අහන්න ඔබතුමන්ල ඇයි දෙපැත්තක ඉන්නෙ.

සභාවේ ඝෝෂාකාරී තත්වයක් ඇතිවිය.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මන්ත්‍රීතුමා මෙම අවස්ථාවේදී චන්ද්‍රසිරි මන්ත්‍රීතුමාට සුභාසිංශන ගෙන ඒමට පමණක් කතා කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

සභාපතිතුමනි අපි ආණ්ඩු පක්ෂ වශයෙන් කතා කරන්නෙ. විපක්ෂයේ තමුන්නාන්සේලාට ප්‍රතිපත්තිමය තීරණයක් ගන්න බැහැ. තමුන්නාන්සේලා අද අනාථයි.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මන්ත්‍රීතුමා සභාපතිතුමා අමතන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

සභාපතිතුමනි මට කියන්න අවශ්‍ය වුනේ අපේ රටේ ජාතික නායකත්වය අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමත් එක්ක පොදු අපේක්ෂකයෙක් විදියට මට සමාවෙන්න ඕනෙ චන්ද්‍රසිරි මැතිතුමා තමුන්නාන්සේග් නායකත්වයට මේ අවස්ථාවේදි මෙහෙම වෙච්ච එක ගැන. පොදු අපේක්ෂකයෙක් හැටියට ඉදිරිපත් කරපු වෙලාවේදි ඒක අවුරුදු 100 කටත් වලංගු වෙන්න ඕනෙ ප්‍රතිපත්තිමය වශයෙන් ඉන්න මහජන නියෝජිතයට සභාපතිතුමනි. එක්සත් ජාතික පක්ෂයට පොදු අපේක්ෂකයව රදව ගන්න බැරි වීම තුල වෙනත් මාර්ගවල මෙතුමල යන අවස්ථාවකදි රටේ වාසනාවට අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති වුනේ. නැත්තම් මේ අවුරුදු තුනත් අවැමෙන් පොදු අපේක්ෂකයටත් පයින් ගහල පක්ෂයේ නායකත්වයත් තියා ගන්න බැරිව නායකත්ව මණ්ඩලයක් තමයි විපක්ෂය තුල තියෙන්නෙ. එහෙම වුනානම් රටම අනාථයි සභාපතිතුමනි. ඒ තත්වය තමයි ප්‍රකාශයට පත් කරන්න ඕන වුනේ මට. මෙතුමාල කරන්නෙ පුද්ගලික වශයෙන් වෛරී දේශපාලනයක්. ඒ තුල ඌටම අපස්සට හරවන්නයි හදන්නෙ. ඒ සම්බන්ධයෙන් කණගාටු වෙනව සභාපතිතුමනි. මම විශ්වාස කරනව මේ මන්ත්‍රීතුමා පක්ෂ හැර දමල යන්න ගත්ත තීරණය නිවැරදියි කියල. මම අපේක්ෂා කරනව ඔබතුමන්ට ඉදිරියේදී මහින්ද චින්තන වැඩ පිළිවෙලට සමගාමීව ඉදිරි වැඩ කටයුතු කරගෙන යාමට අවස්ථාව උදාවේවි කියලා. ඒ සඳහා අපේ චන්ද්‍රසිරි මන්ත්‍රීතුමාට ශක්තිය ධෛර්ය වීර ජිවනය ලැබේවායි පතමින් මම නිහඬ වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි අද දින අපේ සභාවට භාෂිනි විජේසූරිය මන්ත්‍රීතුමිය පැමිණිලා සතුටක් ලබා දුන්නා වගේම එක්සත් ජාතික පක්ෂයේ චන්ද්‍රසිරි මන්ත්‍රීතුමා ඉල්ලා අස්වීම මත දුකක් ඇති වෙනවා. එතුමා අයින් වෙන්නෙ දේශපාලන දිවියේ ඉදිරියට යාමටයි. එතුමාට පළාත් සභාවට යාමට ධෛර්ය ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි අද දින සභාවේ නාගරික මන්ත්‍රීධූරයෙන් ඉත්ව යන කේ. එම්. චන්ද්‍රසිරි මහතා මගේ ගමේ අසල්වැසි මහත්මයෙක්. කිසි  දවසක මමයි චන්ද්‍රසිරි මහත්මයයි අතරෙ නම් කිසිම දවසක ගැටුමක් ඇති වුනේ නැහැ. එතුමා ස්වාධීන තීරණයක් අරගෙන එකම දවසෙ උපන් ඒ ජෙනරාල් ෆොන්සේකා මහතා සමග එකතු වෙන්න තීරණයක් අරගෙන තියෙනවා. මේ අවස්ථාවේදි පළාත් සභාව සඳහා තරග වදින එතුමාටත්, ගරු සභාපතිතුමාටත්, ජනිත් වික්‍රමතිලක මහතාටත් සුභ පාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

කේ. එම්. චන්ද්‍රසිරි මන්ත්‍රීතුමාට මම මේ අවස්ථාවේදි සුභ පතනවා. අපිත් එක්ක මේ සභාවෙ අවුරුදු අටක් නමයක් විතර කටයුතු කරා. අපි අතරෙ පක්ෂ වශයෙන් මොන ප්‍රශ්න තිබුණත් එතුමා මනුෂ්‍යයෙකු වශයෙන් හොඳ ගතිගුණ තිබුන කෙනෙක් විදියටයි මම දකින්නෙ. පක්ෂ කෙසේ වෙතත් එවැනි අය මහජන නියෝජිතයන් වශයෙන් සිටිය යුතු අය. එතුමා මේ අවස්ථාවේදි ක්‍රියා කරපු ආකාරය පිළිබඳවත් මාගේ පැසසුමට ලක් වෙනවා. එතුමාගේ ඉදිරි දේශපාලන දිවියට මගේ ආශිර්වාදය එක් කරනවා.

## (07) ටෙන්ඩර් හා මිල ගණන්

### 7:1 ටෙන්ඩර් හා මිලගණන් :-

### 7:1:1 ටෙන්ඩර් :- නැත

### 7:2 මිල ගණන් :-

**7:2:1** ගබඩා භාණ්ඩ සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ආර්. එම්. රවින්ද්‍ර | රාජපක්ෂ ස්ටෝර්ස් | පූර්ණ හාඩ්වෙයාර් |
|---|---|---|---|---|---|
| 01 | උදලු තල | | 1250/- | **1150/-** | - |
| 02 | උදලු මිටවල් | | 185/- | **175/-** | - |
| 03 | මුල්ලු | | 775/- | **750/-** | - |
| 04 | රේක්ක | | 325/- | **250/-** | - |
| 05 | සවල් | | 585/- | **575/-** | - |

**7:2:2** රතු පස් සැපයීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | පී. එච්. ටී. සී. ද සිල්වා | ටී. එච්. සුරේෂ් චාමික කුමාර | එච්. එච්. තුෂාන් සමීර |
|---|---|---|---|---|---|
| 01 | රතු පස් සැපයීම | | **1350/-** | 1650/- | 1600/- |
| | | | | | |

**7:2:3** ක්‍රීඩා භාණ්ඩ සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Moratuwa Criket Shop | Githmi Sports Goods | Kavindi Sports |
|---|---|---|---|---|---|
| 01 | විකට් කුරු සෙට් | 03 | **1800/-** | 2800/- | 2000/- |
| | | | | | |

**7:2:4** බැකෝ යන්ත්‍ර භාවිතය සඳහා මිල ගණන් කැඳවන ලද අතර ලැබී ඇත්තේ එක් මිල ගණනක් බැවින් හදිසි අවශ්‍යතාවයක් සඳහා සේවය ලබා ගැනීමට අවශ්‍ය බැවින් ලැබී ඇති මිල ගණන පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | මහින්ද නිමාවිතාන | විස්කම් කොන්ක්‍රීට් වර්ක්ස් | |
|---|---|---|---|---|---|
| | ඇළ මාර්ග ශුද්ධ පවිත්‍ර කිරීම සඳහා බැකෝ යන්ත්‍ර භාවිතය (පැයකට) | | **1900/-** | - | |
| | | | | | |

**7:2:5** D4E යන්ත්‍රය භාවිතය සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිළ ගණන පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | විස්කම් කොන්ක්‍රීට් වර්ක්ස් | පියසේන කන්ස්ට්‍රක්ෂන් | උපුල් හෙට්ටිආරච්චි |
|---|---|---|---|---|---|
| | D4E යන්ත්‍රය භාවිතා කිරීම (මීටර පැයකට) | 4:1 | 3000/- | 3300/- | 3350/- |
| | | | | | |

**7:2:6** කාර්යාල උපකරණ සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිළ ගණන පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | පත්මා ෆර්නිචර් | ඩයමන්ඩ් බ්‍රදර්ස් | |
|---|---|---|---|---|---|
| | ලාච්චු 4 වානේ කැබිනට් | | 11200/- | 13500/- | |
| | වානේ අල්මාරි විශාල | | 10500/- | 15500/- | |
| | වානේ අල්මාරි කුඩා | | 7900/- | 10500/- | |

**7:2:7** කැබ් රථයේ රේඩියේටරය සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරීගේ නිර්දේශය මත ලැබී ඇති මිල ගණන පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඩී. එන්. එන්ටර්ප්‍රයිසස් | | |
|---|---|---|---|---|---|
| | No L 200 Radiater | | 25500/- | | |
| | 4D 56 Engine Blade | | 4500/- | | |
| | Hose Clip | | 200/- | | |

**7:2:8** කොම්පෝස්ට් බැරල් සඳහා මිල ගණන් කැඳවන ලද අතර ගණකාධිකාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ගැමි සුමිතුරෝ | විතානගේ කොන්ක්‍රීට් වර්ක්ස් | රුහුණු කොන්ක්‍රීට් වර්ක්ස් |
|---|---|---|---|---|---|
| | කොම්පෝස්ට් බැරල් | | 2990/- | | |
| | | | 3595/- | 3500/- | 3400/- |

**7:2:9** විත්ත රෙදි සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ජයන්ත ටේලර්ස් | ස්පයිඩර් ගාමන්ට්ස් | ෆේවරිට් |
|---|---|---|---|---|---|
| 01 | විත්ත රෙදි | | 112/- | 108/- | 110/- |
| | | | | | |

**7:2:10** ලිපි ද්‍රව්‍ය සඳහා මිල ගණන් කැඳවන ලද අතර ගණකාධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ආරියදාස ප්‍රින්ටර්ස් | සක්වා ප්‍රින්ටර්ස් | ඩී ආර් එස් ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|---|
| 01 | පෝස්ටර් වර්ණ 02 | | 32/50 | 17/50 | 25/- |
| | න. ස. 3 පොත් | | 231/- | 219/- | 247/50 |
| | ලිපි බෙදාහැරීමේ ලේඛන | | 675/- | 562/50 | 750/- |
| | ඉන්ධන ඇනවුම් පොත් | | 300/- | 275/- | 345/- |

**7:2:11** ලිපිද්‍රව්‍ය සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ආරියදාස ප්‍රින්ටර්ස් | සක්වා ප්‍රින්ටර්ස් | ඩී. ආර්. එස්. ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|---|
| | සහතිකපත් | | 49/50 | 42/50 | 47/50 |
| | ෆයිල් කවර | | 62/50 | 55/- | 57/50 |
| | සමරු කලාප | | 53/- | 47/50 | 52/- |
| | සහතිකපත් | | 52/- | 45/- | 50/- |
| | ආරාධනා පත්‍ර | | 27/- | 21/- | 25/- |
| | පෝස්ටර් වර්ණ 4 | | 45/- | 43/- | 47/50 |

**7:2:12** පරිගණක කඩදාසි සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඩී. ආර්. එස්. ප්‍රින්ටර්ස් | ආරියදාස ප්‍රින්ටර්ස් | සක්වා ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|---|
| | පරිගණක කඩදාසි මුද්‍රණය | | | | |
| | GRN | | 14/80 | 15/90 | 12/50 |
| | න. ස. 03 | | 13/50 | 12/50 | 11/80 |

**7:2:13** ත්‍රිරෝද රථ ස්ටිකර් සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සකුරා ප්ලාස්ටික් සහ ස්ටිකර්ස් | ඩබ්.සී. ජේ. සෝමරත්න | මේධාවි ග්‍රැෆික්ස් |
|---|---|---|---|---|---|
| | ත්‍රිරෝද රථවල ඇලවීම සඳහා<br>ඉදිරිපස ස්ටිකර්<br>පිටුපස ස්ටිකර් | | <br>50/-<br>165/- | <br>42/50<br>125/- | <br>46/50<br>145/- |

**7:2:14** ලිපිද්‍රව්‍ය සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඩී. ආර්. එස්. ප්‍රින්ටර්ස් | ආරියදාස ප්‍රින්ටර්ස් | සක්වා ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|---|
| | විදුත් පුස්තකාලය සඳහා බිල්පොත් | | 187/50 | 210/- | 175/- |
| | | | | | |

## (08) ගෙවීම්

8. 1 ඇ. අංක 0954 යටතේ ලබා ගත් printer සඳහා අම්බලන්ගොඩ, වික්‍රමසූරිය පාර, ඔමැක් ටෙක්නොලොජි වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි, රු. 48500/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

Epson LQ 310 Printer 24250/- X 2 - 48500/-

8.2 ඇ. අංක 0758 යටතේ ලබා ගන්නා ලද පරිගණක උපාංග වෙනුවෙන් අම්බලන්ගොඩ, වික්‍රමසූරිය පාර, ඔමැක් ටෙක්නොලොජි වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 27000/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Web Camera | 1900 X 11 | - | 20900.00 |
| Pen Drive 8 GB | 900 X 6 | - | 5400.00 |
| Pen Drive 4 GB | 700 X 1 | - | 700.00 |
| | | | 27000.00 |

8. 3 ඇ. අංක 953 යටතේ ලබා ගත් පරිගණක යන්ත්‍රය සඳහා අම්බලන්ගොඩ , ගාලු පාර, එල් එස් ජේ කම්පියුටර් සෙන්ටර් හි ඔබ්. එල්. එස්. ජයවර්ධන මයා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 108500/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| HP Compaq Desktop computer | 1 X 108500/- | - | 108500.00 |

8.4 ඇ. අංක 0762 හා 794 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ප්‍රින්ටර් හා ටෝනර් වෙනුවෙන් අම්බලන්ගොඩ, වික්‍රමසූරිය පාර, ඔමැක් ටෙක්නොලොජිස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 24500/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| HP Laserjet Printer | 01 X 13000/- | - | 13000.00 |
| Toner | 01 X 11500/- | - | 11500.00 |
| | | | 24500.00 |

8.5 ඇ. අංක 0772 යටතේ ලබා ගන්නා ලද පරිගණක සඳහා අවශ්‍ය ටෝනර් වෙනුවෙන් අම්බලන්ගොඩ, ගාලු පාර, ටියුලිප් කම්පියුටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 72400/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| HP 125 Toner | 2 X 9800/- | - | 19600.00 |
| | 6 X 8800 | - | 52800.00 |
| | | | 72400.00 |

8.6 ඇ. අංක 0749 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද වාහන අමතර කොටස් සඳහා කොළඹ 10, සංඝරාජ මාවත, රත්න මෝටර්ස් පුද්. සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 117200/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| 750 X 16 Rim | 3 X 6750/- | - | 20250/- |
| 600 X 16 Rim | 2 X 4750/- | - | 9500/- |
| 12.4 X 28 Rim | 1 X 31000/- | - | 31000/- |
| Hydrolic Horse | 6 X 4350/- | - | 26100/- |
| Air Cleaner | 3 X 1950 | - | 5850/- |
| Hitch Set | 1 X 24500 | - | 24500/- |
| | | | 117200/- |

8.7 ඇ. අංක 0962 යටතේ ලබා ගන්නා ලද සුදු කොඩි වෙනුවෙන් අම්බලන්ගොඩ, පටබැඳිමුල්ල, එල්. ඉන්ද්‍රාවතී මිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 30000/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| 2 X 10 සුදු කොඩි | 100 X 300/- | - | 3000/- |

8.8 ඇ. අංක 0799 යටතේ ලබා ගන්නා ලද නිළ ඇඳුම් රෙදි සඳහා බලපිටිය, ඒ. නිලූකා ද සිල්වා මිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 89000/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| කලිසම් රෙදි | 200y X 250 | - | 50000/- |
| කමිස රෙදි | 200y X 200 | - | 39000/- |
| | | | 89000/- |

8.9 ඇ. අංක 0753 යටතේ ලබා ගන්නා ලද විදුලි පංකා සඳහා අම්බලන්ගොඩ, ගාලු පාර, දිෂාන් ඇන්ඩ් දිෂානි වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 23700/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Ceiling Fan | 5 X 3800 | - | 19000/- |
| Stand Fan | 1 X 4700 | - | 4700/- |
| | | | 23700/- |

8.10 ඇ. අංක 0787 යටතේ ලබා ගන්නා ලද ක්‍රීඩා භාණ්ඩ සඳහා අම්බලන්ගොඩ, කුලරත්න පාර, ගිත්මි ස්පෝර්ට්ස් ගුඩ්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 27600/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Leather Ball | 48 X 575 | - | 27600/- |

8.11 ඇ. අංක 0800 යටතේ ලබා ගන්නා ලද විදුලි උපකරණ සඳහා බලපිටිය, ගාලු පාර, උයද පුෂ්ප වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 39000/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| 125 M.V. Bulbs | 100 X 390/- | - | 39000/- |

8.12 ඇ. අංක 0766, 0767, 0768 යටතේ ලබා ගන්නා ලද අභ්‍යාස පොත් සඳහා අම්බලන්ගොඩ, මහා විදියේ, චාමර ඉන්ඩස්ට්‍රීස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 1810698/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| 120 තනි රූල් පොත් | 6500 X 26.50 | - | 172250/- |
| 80 තනි රූල් පොත් | 9000 X 18.50 | - | 166500/- |
| 120 කොටු රූල් පොත් | 1215 X 26.50 | - | 32197.50 |
| 120 සුදු ඩ්‍රොවින් පොත් | 410 X 70 | - | 28700/- |
| 80 CR කොටු | 410 X 52 | - | 21320/- |
| 80 සයන්ස් පොත් | 515 X 52 | - | 26780/- |
| 80 රූල් නැති | 60 X 18.50 | - | 1110/- |
| 80 අගල තනිරූල් | 10 X 18.50 | - | 185/- |
| 40 සුදු ඩ්‍රොවින් පොත් | 10 X 28 | - | 280/- |
| 120 රූල් නැති CR | 10 X 54 | - | 540/- |
| 120 රූල් නැති | 10 X 26.50 | - | 265/- |
| කලු ඩ්‍රොවින් පොත් | 680 X 35 | - | 23800/- |
| 120 CR | 1500 X 54 | - | 81000/- |
| 160 CR | 1070 X 73 | - | 78110/- |
| 200 CR | 625 X 89 | - | 55625/- |
| 120 CR කොටු | 410 X 54 | - | 22140/- |
| 160 තනි රූල් පොත් | 8070 X 36 | - | 290520/- |
| 160 කොටු රූල් පොත් | 4025 X 36 | - | 144900/- |
| 200 තනි රූල් පොත් | 9682 X 44 | - | 426008 /- |
| 200 කොටු රූල් පොත් | 1530 X 44 | - | 67320 /- |
| 80 සුදු ඩ්‍රොවින් පොත් | 2180 X 48 | - | 104640/- |
| 80 කොටු රූල් පොත් | 2330 X 18.50 | - | 43105/- |
| 80 කොටු රූල් ½” | 1265 X 18.50 | - | 23402.50 |
| | | | 1810698/- |

8.13 ඇ. අංක 0755 යටතේ ලබා ගන්නා ලද ලිපිගොනු කවර සඳහා අම්බලන්ගොඩ, කුලරත්න පාර, සක්වා ප්‍රින්ටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 29250/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| File Covers | 3000 X 9.75 | - | 29250/- |

8.14 ඇ. අංක 0769 යටතේ පෙර පාසල් සඳහා ලබා ගන්නා ලද අභ්‍යාස පොත් සඳහා අම්බලන්ගොඩ, මහා වීදියේ, චාමර ඉන්ඩස්ට්‍රීස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 39918/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| 80 අගල තනිරූල් | 153 X 18.50 | - | 2830.50 |
| 80 අගල කොටු රූල් | 168 X 18.50 | - | 3108/- |
| 80 රූල් නැති | 738 X 18.50 | - | 13653/- |
| 120 රූල් නැති | 105 X 26.50 | - | 2782.50 |
| 40 සුදු ඩ්‍රොවින් පොත් | 189 X 28 | - | 5292/- |
| 40 කලු ඩ්‍රොවින් පොත් | 149 X 33 | - | 4917/- |
| 120 සයන්ස් පොත් | 105 X 54 | - | 5670/- |
| 80 කොටු රූල් ½” | 90 X 18.50 | - | 1665/- |
| | | | 39918/- |

8.15 ඇ. අංක 0796 යටතේ ලබා ගන්නා ලද Gas සඳහා අම්බලන්ගොඩ, මහ අම්බලන්ගොඩ, එම්. පී. ද සිල්වා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 72400/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| 37.5 kg LP Gas | 10 X 7240 | - | 72400/- |

8.16 ඇ. අංක 0714, 744 යටතේ ලබා ගන්නා ලද ගල් සඳහා අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ, කේ. කේ. සුමිත් ප්‍රියන්ත මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 59600/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Chips | 5 X 5500 | - | 27500/- |
| ¾ Metal | 2 X 4200 | - | 8400/- |
| 1 ½ Metal | 6 X 3950 | - | 23700/- |
| | | | 59600/- |

8.17 ඇ. අංක 0788, 792 යටතේ ලබා ගන්නා ලද ගබඩා භාණ්ඩ සඳහා අම්බලන්ගොඩ, මහාවීදිය, ඉදුනිල් හාඩ්වෙයාර් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 51679/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | | |
|---|---|---|---|---|
| Weather Shield | 24L | X 907.25 | - | 21774/- |
| 5” Paint Brushes | 01 | X 975 | - | 975/- |
| 7/053 Wire | 01 | X 9700 | - | 9700/- |
| Enamel Paint | 08 | X 898.75 | - | 7030/- |
| Anticorrosive | 08 | X 622.50 | - | 5300/- |
| Pad Locks 1 ½” | 06 | X 450 | - | 2700/- |
| Pad Locks 1” | 14 | X 300 | - | 4200/- |
| | | | | 51679/- |

8.18 ඇ. අංක 0732 යටතේ ලබා ගන්නා ලද ගබඩා භාණ්ඩ සඳහා කොළඹ 12, පරණ යාන් වීදිය, අරලිය ස්ටීල් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 87500/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | | |
|---|---|---|---|---|
| GI Pipes | 1750/- | 50 | - | 87500/- |

8.19 ඇ. අංක 0784 යටතේ ලබා ගන්නා ලද Gas සඳහා අම්බලන්ගොඩ, මහ අම්බලන්ගොඩ, එම්. පී. ද සිල්වා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 72400/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

37.5 kg LP Gas 10 X 7240 - 72400/-

8.20 නගර සභාව සතු 252 - 0730 අංක දරණ කැබ්රථය සඳහා 2013 දෙසැම්බර් මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 27333.10 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4408 | ඩීසල් | 45 |
| | එන්ජින් ඔයිල් | 01 |
| 4414 | ඩීසල් | 30 |
| 4418 | ඩීසල් | 48 |
| 4426 | ඩීසල් | 58 |
| 4435 | ඩීසල් | 40 |

**මෙම ගෙවීම සඳහා ඡන්දය විමසනු ලදුව ගෙවීමට පක්ෂව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා, ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂමී හේමන්තා ද සිල්වා මෙනවිය , ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමණයගේ මහතා ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා, ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. හාෂිනි මේනුකා විජේසූරිය මිය යන අයද , විපක්ෂව ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේවි රොහාන් ද සිල්වා මහතා , ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා යන අයද ඡන්දය ප්‍රකාශ කල අතර වැඩි ඡන්ද හතරකින් මෙම ගෙවීම සභා සම්මත විය.**

8.21 නගර සභාව සතු 49 - 9422 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 දෙසැම්බර් මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 11787.80 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4410 | ඩීසල් | 41 |
| | එන්ජින් ඔයිල් | 03 |
| 4422 | ඩීසල් | 14 |
| 4439 | ඩීසල් | 33 |

8.22 නගර සභාව සතු LF-1853 අංක දරණ ටිපර් රථය සඳහා 2013 දෙසැම්බර් මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 15743.00 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4412 | ඩීසල් | 60 |
| 4423 | ඩීසල් | 70 |

8.23 නගර සභාව සතු 252 - 0730 අංක දරණ කැබ්රථය සඳහා 2013 දෙසැම්බර් මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 26278.70 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සි/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4447 | ඩීසල් | 65 |
| 4457 | ඩීසල් | 57 |
| 4461 | ඩීසල් | 38 |
| 4471 | ඩීසල් | 57 |

**මෙම ගෙවීම සඳහා ඡන්දය විමසනු ලදුව ගෙවීමට පක්ෂව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා, ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂමී හේමන්තා ද සිල්වා මෙනවිය , ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමණයගේ මහතා ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා, ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. භාෂිනී මේනුකා විජේසූරිය මිය යන අයද , විපක්ෂව ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා , ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා යන අයද ඡන්දය ප්‍රකාශ කල අතර වැඩි ඡන්ද හතරකින් මෙම ගෙවීම සභා සම්මත විය.**

- ප. ව. 12.10 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා සභාවෙන් පිටව යන ලදී.

8.24 නගර සභාව සතු RA-8796 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 දෙසැම්බර් මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 11245.70 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සි/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4448 | ඩීසල් | 51 |
| | එන්ජින් ඔයිල් | 02 |
| 4467 | ඩීසල් | 36 |

8.25 නගර සභාව සතු 49- 9422 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 දෙසැම්බර් මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 12941.10 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සි/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4450 | ඩීසල් | 28 |
| | එන්ජින් ඔයිල් | 02 |
| 4460 | ඩීසල් | 34 |
| 4473 | ඩීසල් | 39 |

8.26 නගර සභාව සතු LF-1853 අංක දරණ ටිපර් රථය සඳහා 2013 දෙසැම්බර් මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 15985.20 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සි/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4445 | ඩීසල් | 67 |
| 4456 | ඩීසල් | 65 |

8.27 නගර සභාව සතු GL-9369 අංක දරණ ගලි බවුසර රථය සඳහා 2013 දෙසැම්බර් මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 18043.90 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4462 | ඩීසල් | 149 |

8:28 2013 නොවැම්බර් මාසයට අදාල විදුලි බිල්පත් සඳහා සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට ගෙවීම.

| වැය අංකය | සැප්තැම්බර් |
|---|---|
| 11453 I | 47106.77 |
| 23453 I | 2280.01 |
| 34453 I | 3185.63 |
| 52453 I | 64356.01 |
| 53454 | 16184.25 |
| 62453 I | 28900.66 |
| | 162013.33 |

විදුලි බිල්පත් සඳහා රු. **162013.33** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:29 2013 නොවැම්බර් මාසයට අදාල ජල බිල්පත් සඳහා ජාතික ජල සම්පාදන මණ්ඩලයට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 52453 II | 23454.10 |
| 62453 II | 12995.50 |
| 34453 II | 1024.80 |
| 23453 II | 15640.78 |
| 11453 II | 9181.76 |
| | **62296.94** |

ජල බිල්පත් සඳහා රු: **62296.94** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

.

8:30 2013 නොවැම්බර් මාසයට අදාල දුරකතන බිල්පත සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවීම.

| වැය අංකය | සැප්තැම්බර් |
|---|---|
| 11452 | 29666.25 |
| 12452 | 1163.28 |
| 25451 II | 2518.80 |
| 62452 I | 5019.11 |
| | **38367.44** |

දුරකතන බිල්පත සඳහා රු **38367.44** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.31 අම්බලන්ගොඩ නගර සභාව මගින් පාලනය වන පුස්තකාල සඳහා දෙසැම්බර් මාසයට සපයන ලද පුවත්පත් වෙනුවෙන් රු. 40415/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි එම්. එස්. වීරසිංහ මහතා වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.32 2013 - iv කාර්තුව වැට් බදු ආපසු ගෙවීම සඳහා රු. 199308.12 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත සභා අනුමැතියට යටත්ව ගෙවීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.33 අම්බලන්ගොඩ හිරේවත්ත, උස්වැල්ල පාර 11/2 ලිපිනයෙහි පදිංචි කේ. එස්. ටී. ප්‍රේමසිරි මහතා ධීවර කාර්මිකයෙකු බැවින් ධීවර ශාලාව වෙන් කිරීම් කල මුදලෙන් 25% ක මුදල වන රු. 875/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි කේ. එස්. ටී. ප්‍රේමසිරි මහතා වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:34 mskak¥j III jk yria mdr me;sneïu boslsÍu l¾udka;fha /|jqï uqo, jk re' 7386.47 l uqo,la jev wêldÍ yd f,alïf.a ks¾foaYh mßos flrñKsh l=vd .ïudk iñ;sh fj; f.ùug iNdfõ wkque;sh ,nd දෙන ලදී.

8:35 2013 Tlaf;daïn¾" fkdjeïn¾" foieïn¾ udi 03 i|yd uqoaor nÿ jYfhka re' 33581.09 l uqo,la f,alïf.a ks¾foaYh mßos foaYSh wdodhï flduidßia ckrd,a fj; f.ùug iNdfõ wkque;sh ,nd දෙන ලදී.

8:36 uqyqÿ fjr< mdr ldKq boslsÍfï l¾udka;fha wjidk f.jSu jk re' 298035.83 l uqo,la jev wêldÍ yd f,alïf.a ks¾foaYh mßos fjr< mdr I .%dóh iuDoaê iñ;sh fj; f.ùug iNdfõ wkque;sh ,nd දෙන ලදී.

8:37 uqyqÿ fjr< mdr ldKq boslsÍfï l¾udka;fha ^w;sf¾l& wjidk f.jSu jk re' 53084.24 l uqo,la jev wêldÍ yd f,alïf.a ks¾foaYh mßos fjr< mdr I .%dóh iuDoaê iñ;sh fj; f.ùug iNdfõ wkque;sh ,nd දෙන ලදී.

8:38 fymamquq,a, fmr mdi, w¨;ajeähd lsÍfï l¾udka;fha ^w;sf¾l& wjidk f.jSu jk re' 178682.66 l uqo,la jev wêldÍ yd f,alïf.a ks¾foaYh mßos fjr< mdr I .%dóh iuDoaê iñ;sh fj; f.ùug iNdfõ wkque;sh ,nd දෙන ලදී.

## (09) ගිණුම්

**9:1** 2013 දෙසැම්බර් මාසයේ වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය - පොදු ගිණුම, මුදල් සාරාංශය හා ලැබීම් විග්‍රහය සභාවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව 2013 දෙසැම්බර් මස ගිණුම් වාර්තා පිළිගතයුතු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතාගේ හා ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## (10) ඇස්තමේන්තු

**10:1** කරිත්තකන්ද පන්සල ඉදිරිපිට පිරිස් වෙද මාවතෙහි කාණුව ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් වැඩ අධිකාරී මහතා විසින් සකස් කරන ලද රු. 149805.48 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10:2** පිරිස් වෙද මාවතෙහි වරිපනම් අංක 03 අසල පෙට්ටි බෝක්කුවක් ඉදිකිරීමේ කර්මාන්තය වෙනුවෙන් වැඩ අධිකාරී මහතා විසින් සකස් කරන ලද රු. 444840.99 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10:3** lkao udj; <ud WoHdkh boslsÍfï l¾udka;h fjkqfjka jev wêldÍ uy;d úiska ilia lrk ,o re' 1270708.72 la jQ weia;fïka;=j සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10:4** mskak¥j jgrjqu ud¾.fha fldgila m%;sixialrKh lsÍfï l¾udka;h fjkqfjka jev wêldÍ uy;d úiska ilia lrk ,o re' 133994.02 la jQ weia;fïka;=j සභාගත කරන ලදී.

__තීරණය__

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**(11)** වෙනත් කරුණු

11:1 " 2014- අම්බලන්ගොඩ වෙසක් කලාපය සඳහා ආධාර එකතු කිරීම සඳහා කැටයක් ඇල්ලීමට අවසර ලබා දීම සම්බන්ධයෙනි " මැයෙන් අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමයේ ලේකම්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය 2014 වර්ෂයේ වෙසක් මස අම්බලන්ගොඩ බෞද්ධ කලාපුරවරය වෙසක් කලාපයක් බවට පත් කිරීමට අදහස් කොට ඇති බවත් මෙම සත්කාර්ය සඳහා කැටයක් භාවිතා කරමින් මුදල් එකතු කිරීමට අම්බලන්ගොඩ බස් නැවතුම්පොල හා එහි අවට භාවිතා කිරීමට සංගමයට අවසර ලබා දෙන ලෙසත් ( 2014 ජනවාරි 28 සිට 2014 මැයි 13 දක්වා ) ඉල්ලා තිබුණි.

__තීරණය__

☞ **2014 ජනවාරි 28 සිට 2014 මැයි 13 දක්වා කාලය තුල අම්බලන්ගොඩ බස් නැවතුම්පොල හා එහි අවට ප්‍රදේශය තුල කැටයක් භාවිතා කරමින් මුදල් එකතු කිරීමට අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමයට අවසර ලබා දීමට සභාව තීරණය කරන ලදී.**

11:2 " භාණ්ඩාගාර බිල්පත් ආයෝජනයෙන් මුදල් ආපසු ලබා ගැනීමට අනුමැතිය ලබා ගැනීම " මැයෙන් නගර සභාවේ පොත් තබන නිලධාරිණිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2013-12-27 දිනට සේවක ණය ගිණුමෙහි රු. 414250.35 ක ධන ශේෂයක් පවතින බවත් 2014 වර්ෂයේ විශේෂ අත්තිකාරම් සහ ආපදා ණය ගෙවීම සඳහා රු. 467500.00 ක මුදලක් අවශ්‍ය බවත් ඒ අනුව රු. 53250.00 ක මුදලක් තව දුරටත් අවශ්‍ය බවත් අද දින වන විට සේවක ණය ලෙස භාණ්ඩාගාර බිල්පත් වල රු. 860000.00 ක මුදලක් ආයෝජනය කර ඇති බවත් ඉහත ණය ගෙවීම සඳහා රු. 75000.00 ක මුදලක් ආපසු ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

__තීරණය__

☞ **ඉහත ණය ගෙවීම සඳහා භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර ඇති මුදලින් රු. 75000.00 ක මුදලක් ආපසු ලබා ගැනීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

11:3 " කායවර්ධන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම " මැයෙන් අම්බලන්ගොඩ වෝකින් ක්ලබ්හි ලේකම්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

නිරෝගිමත් පරපුරක් බිහිකිරීම උදෙසා අම්බලන්ගොඩ නගර සභාව මගින් පිහිටවනු ලබන කායවර්ධන මධ්‍යස්ථානය සම්බන්ධව තම සංගමයේ ප්‍රශංසාව හිමිවන බවත් සංගමයේ අරමුදලින් රුපියල් ලක්ෂයක මුදලක් කායවර්ධන උපකරණ ලබා ගැනීම සඳහා ලබා දීමට සංගමය තීරණය කර ඇති බවත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

## (12) න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12:1** ' 2013 අයවැය ලේඛනය - වැය ශීර්ෂ අතර ප්‍රතිපාදන මාරු කිරීමට අනුමැතිය ලබා ගැනීම ' මැයෙන් පොත් තබන නිලධාරිණිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2013 අයවැය ලේඛනයට අදාලව ප්‍රතිපාදන ඉක්මවා ඇති වියදම් වැය ශීර්ෂ වෙනුවෙන් වෙනත් වැය ශීර්ෂ වලින් මුදල් මාරු කර ගැනීමට මු. රෙ. 66 යටතේ අනුමැතිය ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **2013 අයවැය ලේඛනයේ වැය ශීර්ෂ අතර ප්‍රතිපාදන මාරු කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:2** ' අංක SD/2013/138 ' දරණ අනුබෙදුම සභාගත කරන ලදී.

අංක SD/2013/138 ' දරණ අනුබෙදුම් සැලැස්ම අනුව අංක 1111E දරණ පිඹුරේ ප්‍රකාර පෙන්වන ලොට් 4A, 4B, 4E දරණ ඉඩම් කැබලි සඳහා නගර සභා ආඥා පනත අනුව 1% විකිණීම මත බදු මුදල අය කල යුතු බවට ආදායම් පරීක්ෂක මහතා විසින් වාර්තාව ඉදිරිපත් කර තිබුණි.

අම්බලන්ගොඩ දේගොඩ අංක 20/1A හි පදිංචි ඩබ්ලිව්. ඩී. විමලතුංග වන තමා විසින් අංක 1111E දරණ පිඹුර අනුබෙදුම සඳහා ඉදිරිපත් කර ඇති බවත් එහි 4E කැබැල්ල තමා නමින් පවත්වාගෙන යන බවත් 4A කැබැල්ල මාගේ සොයුරිය වන ඩබ්ලිව්. විනිතා නමින් පවත්වාගෙන යන බවත් 4B දරණ ඉඩම් කැබල්ල මාගේ දියණිය වන වඩුගේ සමන්ති හර්ෂනී යන අයට ත්‍යාගයක් වශයෙන් ලබා දුන් බවත් එය විකිණීමක් නොවන බවත් සඳහන් කොට දිව්රුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර තිබුණි.

**තීරණය**

☞ අංක 1111E දරණ පිඹුරේ ප්‍රකාර පෙන්වන ලොට් 4A, 4B, 4E දරණ ඉඩම් කැබලි වලින් 4B දරණ ඉඩම් කැබැල්ල තම දියණිය වන වඩුගේ සමන්ති හර්ෂනී යන අයට ත්‍යාගයක් වශයෙන් ලබා දෙන බැවින් 1% ගාස්තු අය නොකිරීමටත් එම නමින් හැර වෙනත් නමකට හැරවීමේදී 1% ගාස්තු අය කිරීම සිදු කල යුතු බවට වරිපනම් ලේඛනයේ සඳහන් කිරීමටත් 4A සහ 4E දරණ ඉඩම් කැබලි දෙක ද විකිණීමක් සිදුවන අවස්ථාවකදී 1% ගාස්තු අය කිරීමටත් සභාව තීරණය කරන ලදී.

**12:3** ' බක්මහ උළෙල පැවැත්වීමට මහජන ක්‍රීඩාංගණය නොමිලේ ලබා ගැනීම සඳහා ' මැයෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීතුමා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

පාසල් දරුවන්ට හා රැකියා අපේක්ෂකයින්ට අවශ්‍ය තොරතුරු තාක්ෂණ දැනුම, පුහුණු වැඩමුලු හා රජයේ සෑම අංශයක්ම ආවරණය වන පරිදි පුහුණු වැඩ සටහන් සාර්ථකව ක්‍රියාත්මක කරන ආයතනයක් වන අප ආයතනය සෑම වසරකම ක්ෂෙත්‍ර අධ්‍යාපන වැඩසටහනක් සංවිධානය කරන ලද අතර මෙවර බක්මහ උළෙලක් පැවැත්වීමට අදහස් කර ඇති බවත් ඒ සඳහා 2014 අප්‍රේල් 20 දින නගර සභා ක්‍රීඩා පිටිය සහ පුටු කිහිපයක් ද ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පුහුණු කිරීමේ මධ්‍යස්ථානය විසින් පවත්වන බක්මහ උළෙල සඳහා 2014 අප්‍රේල් මස 20 දින නගර සභා ක්‍රීඩා පිටිය සහ අවශ්‍ය පුටු නොමිලයේ ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:4** ' වාර්ෂික පුහුණු වැඩ සටහන 2014 ' මැයෙන් සංවර්ධන නිලධාරී එම්. පී. ආර්. පුෂ්පකුමාර මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභාවේ පුහුණු වැඩ සටහන් වෙනුවෙන් 2014 වර්ෂය සඳහා මුදල් වෙන් කර ඇති බවත් පුහුණු වැඩ සටහන් තුලින් කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමට බලාපොරොත්තු වන බවත් මේ වෙනුවෙන් කාර්ය සාධන තරගයේදී ලකුණු ලබා දීමද සිදු වන බවත් ඒ අනුව වෙන් වෙන් වශයෙන් පුහුණු වැඩ සටහන් පැවැත්වීම සුදුසු බවත් වැඩ සටහන් හතරක් වනසේ එය පැවැත්වීඹ යෝග්‍ය බවත් ඒ අනුව ප්‍රථම එක්දින පුහුණු වැඩ සටහන කාර්යාල කාර්ය මණ්ඩලය සඳහා 2014- 02- 27 දින වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් කන්නෙළිය වන රක්ෂිතයේ පිහිටි දේශන ශාලාවේදී පැවැත්වීමට අදහස් කර ඇති බවත් ඒ සඳහා වන ඇස්තමේන්තුව රු. 50000.00 ක් බවත් ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ **නගර සභා කාර්ය මණ්ඩලය සඳහා කන්නෙළිය වන රක්ෂිතයේ පිහිටි දේශන ශාලාවේදී පැවැත්වීමට නියමිත පුහුණු වැඩසටහන සඳහා රු. 50000.00 ක් වූ ඇස්තමේන්තු මුදල සහ ඉල්ලීම් කර ඇති අනෙකුත් පුහුණු වැඩ සටහන් වෙනුවෙන් වූ ඇස්තමේන්තු මුදල් ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:5** ' 2013- 12- 31 දිනට ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණ වාර්තාව " සභාගත කරන ලදී.

**2013.12.31 දිනට ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණ වාර්තාව**

ආයතනයේ සියලුම අංශ ආවරණය වන පරිදි ඉන්වෙනට්‍රි භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2014.01.31 දින දක්වා සිදු කරන ලද අතර පහත සඳහන් පරිදි විශ්ලේෂණය කර අපගේ නිර්දේශ ඉදිරිපත් කරන්නෙමු.

01. සමීක්ෂණයට ඉදිරිපත් කිරීමට නොහැකි වු භාණ්ඩ.

02. ආයතනයේ දැනට සේවයේ නොමැති, ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගොස් ඇති නලධාරීන් භාරදී නොමැති භාණ්ඩ.

03. ඉන්වෙන්ට්‍රි ලේඛණයට ඇතුලත් කල යුතු භාණ්ඩ.

04. ඉවත් කල යුතු හා වෙන්දේසි කල යුතු භාණ්ඩ.

05. ගංවතුරට විනාශ වී ඇති ඉවත් කල යුතු භාණ්ඩ.

**01. සමීක්ෂණයට ඉදිරිපත් කිරීමට නොහැකි වු භාණ්ඩ.**

කේ. ඒ. විසුද්ධි රේණුකා මිය, අනීෂා සංජි කුමාරි මිය, එම්. ඩබ්. චන්‍දසීලි ද සිල්වා මිය, ආශා හර්ෂනී විජේනායක මිය, දර්ශනී මේබලා මෙනවිය, පී. කුසුම් ද සිල්වා මිය, එච්. යසරත්න මයා, පී. එච්. එල්. සී. පුෂ්පරාණි මිය, ඩබ්ලිව්. සිරිපාල මයා සහ නිසංසලා පියුමි කුමාරි මියගේ නමින් ඉන්වෙන්ට්‍රි ගතවී ඇති සමීක්ෂණයේදී ඉදිරිපත් කිරීමට නොහැකි වු භාණ්ඩ සඳහන් කර තිබුණි.

**නිර්දේශය - මෙම නිලධාරීන් හා සේවකයන් දැනට සේවයේ යෙදී සිටින බැවින්, සමීක්ෂණයට ඉදිරිපත් කිරීමට නොහැි වු භාණ්ඩ පිළිබඳ විමසීමක් කර පිලිගත හැකි හේතුන් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම් වටිනාකම අයකර ගැනීම නිර්දේශ කරන්නෙමු.**

02. ආයතනයේ දැනට සේවයේ නොමැති, ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගොස් ඇති නලධාරීන් භාරදී නොමැති භාණ්ඩ.

කේ. ලංකා ද සිල්වා මයා, රවීන්ද්‍ර ගිනිගේ මයා, එච්. ටී. සිරිසේන මයා, පී. ක්‍රිෂාන්ත ද සිල්වා මයා, හෂාන් කුමාර මයා, යූ. ඩබ්. ගුණසිරි මයා, එම්. නාලනී ඉන්ද්‍රානි මිය, කේ. ඒ. බන්දුල මයා, අනුෂා සුරංගනී ද සිල්වා මිය සහ ඒ. ඒ. නිලූකා නදීශානි මිය භාරයේ ඇති භාණ්ඩ පිළිබඳව සඳහන් කර තිබුණි.

**නිර්දේශය - ඉහත නම් සඳහන් නිලධාරීන් හා සේවකයන්ගේ අදාළ භාණ්ඩ පිළිබඳව පිළිගත හැකි හේතු ඉදිරිපත් නොකරන්නේ නම් වටිනාකම අයකර ගැනීම නිර්දේශ කරන්නෙමු.**

**03. ඉන්වෙන්ට්‍රි ලේඛණයට ඇතුල් කළ යුතු භාණ්ඩ**

බී. ඩී. ඊ. කොඩිතුවක්කු මිය, ටී. චින්තා ද සිල්වා මිය, දර්ශනී මේබලා මිය සහ දිලිනි මියගේ ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුලත් කල යුතු භාණ්ඩ සඳහන් කර තිබුණි.

**නිර්දේශය - ඉහත සඳහන් භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ලේඛණයට ඇතුලත් කිරීමට නිර්දේශ කරමු.**

**04. ඉවත් කල යුතු හා වෙන්දේසි කල යුතු භාණ්ඩ**

කේ. ඒ. විසුද්ධි රේණුකා මිය අනීෂා සංජි කුමාරි මිය එච්. ඩී. ශාන්තා මිය එස්. එච්. මනෝරි චන්‍දවංශ මිය එම්. එච් පද්මසේන මයා, බී. ඩී ඊ. කොඩිතුවක්කු මිය, ආශා හර්ෂනී විජේනායක මිය, ඊ. බී. බන්දුලසිරි මයා, ඊෂා ක්‍රිෂාන්ති මිය පී. අශෝක කුමාර මයා ඩබ්. සිරිපාල මයා ගෞරි වරුෂවිතාන මිය කේ. කේ.

දිලිනි නිලංකා මිය පී. එස්. නිසංසලා පියුමි කුමාරි මිය සහ පී. එස්. අමරලාල් මයා සතුව ඇති ඉවත් කල යුතු හා වෙන්දේසි කල යුතු භාණ්ඩ සඳහන් කර තිබුණි.

**05. ගංවතුරට විනාශ වී ඇති ඉවත් කල යුතු භාණ්ඩ ලේඛනයද ඉදිරිපත් කර තිබුණි.**

**වෙනත් කරුණු :-**

01. මෙම සමීක්ෂණය අනුව බඩු වට්ටෝරු ලේඛණයෙන් ඉවත් කිරීමට නිර්දේශ කර ඇති භාණ්ඩ පිළිබඳව අනුමැතිය ලැබීමෙන් පසු මාර්තු 31 දිනට පෙර බඩු වට්ටෝරු ලේඛණයෙන් ඉවත් කිරීම සුදුසු බව නිර්දේශ කරන්නෙමු.

02. දැනට විදේශගතව ඇති සෞඛ්‍ය උප පරිපාලක රවීන්ද්‍ර ගිනිගේ මහතා නමින් ඇති භාණ්ඩ (පිටු අංක 02) සුදුසු පරිදි සෞඛ්‍ය උප පරිපාලක ටී. බන්දුසීල මහතා වෙත භාරදීමට සුදුසු බව නිර්දේශ කරමු.

03. ආරක්ෂක නියාමක වශයෙන් සේවය කරන ලද කේ. ඒ.බන්දුල මයා නමින් ඇති ඉන්වෙන්ට්‍රි භණ්ඩ (පිටු අංක ) භාරදී නොමැති අතර ගු සේවය අත්හැර ගොස් ඇත. ඔහුගේ නමින් ඇති භාණ්ඩ සම්බන්ධයෙන් ලිඛිතව දන්වා හැරීමෙන් පසුව ඔහු විසින් විධිමත් පරිදි භාරදීමක් සිදු නොකරන්නේ නම් නීති මගින් කටයුතු කිරීමට නිර්දේශ කරන්නෙමු.

04. දැනට භාවිතා වන ඉන්වෙන්ට්‍රි ලේඛණය සුදුසු පරිදි ඒ ඒ අංශයන්ට අදාල වන ලෙස ඉන්වෙන්ට්‍රිගත කිරීමටත් නිර්දේශ කරන්නෙමු.

05. තාවකාලික/පුහුණුවීම් කටයුතු සඳහා පැමිණෙන නිලධාරීන්/සේවකයින්ගේ නමින් භාණ්ඩ නිකුත් නොකිරීමටත්, 'වා වුන්ගේ මින් ඉන්වෙන්ට්‍රිගත තනොකිරීමටත් නිර්දේශ කරන්නෙමු.

06. කාර්යාලයේ ඇති මේස, පුටු ආදිය කම නිලධාරියෙකු නමින් ඉන්වෙන්ට්‍රිගත කිරීමටත් අනෙකුත් භාණ්ඩ ඒ ඒ නිලධාරීන් නමින් ඉන්වෙන්ට්‍රි ගත කිරීමටත් නිර්දේශ කරන්නෙමු.

07. ආදායම් පරිපාලක සිතාර මංජුල නයනජිත් මහතා නමින් ඉන්වෙන්ට්‍රිගත වී ඇති නගර ශාලාවේ භාණ්ඩ නගර ශාලා භාරකරු නමින් ඉන්වෙන්ට්‍රිගත කිරීම සුදුසු බව නිර්දේශ කරන්නෙමු.

**මෙම සමීක්ෂණ කටයුත්තේදී සහයෝගය ලබාදුන් සියළුම නිලධාරීන්ට හා සේවකයින්ට ස්තූතිය පල කරන්නෙමු.**

**සමීක්ෂණ මණ්ඩලය**

**01. එම්. සාගරිකා රුවන්මාලා -**

**02. බුද්ධිනි ප්‍රභා -**

**03.**

**අධීක්ෂණ මන්ත්‍රී මණ්ඩලය**

**01. ගරු උපසභාපති, කමල් වැල්ලගේ මහතා -**

**02. ගරු නගර සභා මන්ත්‍රී, කේ. එම්. චන්ද්‍රසිරි මහතා -**

**තීරණය**

☛ **ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:6** ‘ 2013- 12- 31 දිනට ගබඩා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ‟ සභාගත කරන ලදී.

<u>2013.12.31 දිනට ගබඩා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව</u>

2013.12.03 වන දින මාසික සභා රැස්වීමේ තිරණ අංක 12.13 අනුව 2013.12.31 දිනට ගබඩාවේ තත්‍ය ශේෂයන් ගණනය කරමින් සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වූ පහත කරුණු සභාවේ දැන ගැනීම සහ ඉදිරි අවශ්‍ය තිරණ ගැනීම සඳහා ඉදිරිපත් කරමු.

01. 2000 වර්ෂයට පෙර සිට ගබඩා භාරකරු වශයෙන් රාජකාරි කල ස්ථාන මාරු වී ගිය බී.පී.බන්දුල මහතාගෙන් ඇතිවූ ඌණතාවය සම්බන්ධයෙන් මීට පෙර සිදු කරන ලද සෑම භාණ්ඩ සමීක්ෂණයකදීම එම මහතාට සහ පළාත් පාලන කොමසාරිස්තුමාට ද දන්වා ඇතත්, මේ දක්වා එම ගැටලුව සඳහා විසඳුම් ලැබී නොමැති අතර, ගබඩා ලේඛණවල ඌණතාවයන් සඳහන් වීම ගැටලුවක්ව පවතී. ඒ සම්බන්ධයෙන් සභාවේ තිරණයක් ගැනීමට ඉදිරිපත් කරන්නෙමු.

02. පොදු 47 ආකෘතිය යටතේ අප විසින් සඳහන් කර ඇති ප්‍රයෝජනයට ගතනොහැකි භාණ්ඩ (ගබඩා කාමර අංක 03 හි ඇති) වෙන්දේසි කිරීමටත් එම ආකෘතියෙහි D අකුර සඳහන් කර ඇති ප්‍රයෝජනයට ගත නොහැකි වෙන්දේසි කළ නොහැකි අබලි ද්‍රව්‍ය විනාශ කිරීමටත්, නිර්දේශ කරමු.

03. වර්තමාන ගබඩා භාරකරු ඩබ්.එම්.උදා මහීමා දයාරත්න මහත්මිය යටතේ ගබඩා භාණ්ඩ වල ලේඛණගත ශේෂය සහ තත්‍ය ශේෂය නිවැරදි වන අතර භාණ්ඩ ඌණතාවයක් හෝ අතිරික්තයක් නොමැති බව සතුටින් සඳහන් කරමු.

04. ගබඩා අංශයට වැසිකිළි පහසුකම් ලබා දීම සුදුසු බව ද යෝජනා කරමු.

05. ගබඩා අංශයේ වහළ අලුත්වැඩියා කර සිවිලිම පින්තාරු කිරීම ද සුදුසු බවට යෝජනා කරමු.

06. ගබඩා පරිශ්‍රය තුල සියලුම භාණ්ඩ සුරක්ෂිත ලෙස හා ක්‍රමවත් ලෙස අසුරා තිබීම නිසාත්, ක්‍රමවත්ව යාවත්කාලිනව කරන ලද ගබඩා ලේඛණ ඉදිරිපත් කිරීම නිසාත්, භාණ්ඩ සමීක්ෂණ කටයුතු සාර්ථකව නිම කිරීමට හැකිවූ බව සතුටින් දන්වමු.

07. ගබඩා පරිශ්‍රයේ (මිදුල) ගබඩා භාරකරු විසින් මල් වගා කර තිබීමත් අගය කරමු.

සමීක්ෂණ මණ්ඩලයඃ-

| | |
|---|---|
| සභාපතිඃ- | කලමණාකරන සහකාර 1 පන්තිය - පී.කුසුම් ද සිල්වා |
| සාමාජික:- | කලමණාකරන සහකාර 111 පන්තිය - ඒ.කේ. ගාල්ලගේ |
| ගබඩා භාරකරු:- | කලමණාකරන සහතාර 11 පන්තිය - ඩබ්.එම්.යූ. මහීමා දයාරත්න |
| අධීක්ෂණ මන්ත්‍රී :- | ගරු නගර සභා මන්ත්‍රී ජී.ඩබ් ජගත් කුමාර මහතා. |
| අධීක්ෂණ මන්ත්‍රී :- | ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහාන් මහතා. |

- 2000 වර්ෂයට පෙර ගබඩා භාරකරු ලෙස සේවය කරන ලද බී. පී. බන්දුල මහතාගේ 2013- 12- 31 දක්වා නොපියවූ ගබඩා ඌනතාවයන් පිළිබඳ වාර්තාව සහ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ පිළිබඳ ලේඛනයක් ද ඉදිරිපත් කර තිබුණි.

<u>තීරණය</u>

☛ **ගබඩා භාරකරු වශයෙන් රාජකාරී කල ස්ථාන මාරු වී ගිය බී. පී. බන්දුල මහතාගෙන් ඇති වූ ඌණතාවය සම්බන්ධයෙන් නැවත වරක් පළාත් පාලන කොමසාරිස්තුමා සහ බී. පී. බන්දුල මහතා දැනුවත් කිරීමටත් පොදු 47 ආකෘතිය යටතේ සඳහන් කර ඇති ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ වෙන්දේසි කිරීමටත් ප්‍රයෝජනයට ගත නොහැකි වෙන්දේසි කළ නොහැකි අබලි ද්‍රව්‍ය විනාශ කිරීමටත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:7** ' 2013- 12- 31 දිනට පුස්තකාල සමීක්ෂණ වාර්තාව " සභාගත කරන ලදී.

<u>2013/12/31 දිනට පුස්තකාල පොත් සමීක්ෂණ වාර්ථාව</u>

අම්බලන්ගොඩ නගර සභාවේ 2012/12/03 දින පැවැත්වූ මහ සභාවේ තීරණ අංක 12:13 අනුව නගර සභා ප්‍රධාන පුස්තකාලයේ හා ශාඛා පුස්තකාලවල 2013/12/31 දින දක්වා පුස්තකාල පොත් පිළිබඳ සිදුකරන ලද සමීක්ෂණ වාර්ථාව පහත සඳහන් කරන්නෙමු.

**01. පොත් පිළිබඳ සමීක්ෂණ වාර්ථාව**

| අංකය | **පුස්තකාලයේ නම** | **මුළු පොත් සංඛ්‍යාව** | **විනාශ කිරීමට නිර්දේශ පොත්** | **ඉදිරිපත් නොවූ පොත්** | **2013/12/31 දිනට පොත් සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|
| 01 | ප්‍රධාන පුස්තකාලය | **18682** | **32** | **36** | **18646** |
| 02 | මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලය | **3691** | **17** | **28** | **3663** |
| 03 | ඕකන්ද ශාඛා පුස්තකාලය | **1594** | - | - | **1594** |
| 04 | පෝරඹ ශාඛා පුස්තකාලය | **2795** | **07** | - | **2795** |
| 05 | පොල්වත්ත ශාඛා පුස්තකාලය | **2383** | - | - | **2383** |
| 06 | හෙප්පුමුල්ල ශාඛා පුස්තකාලය | **1393** | - | - | **1393** |
| 07 | හිරේවත්ත ශාඛා පුස්තකාලය | **1649** | - | - | **1649** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 08 | කෙරමිණිය ශාඛා පුස්තකාලය | **1648** | - | - | **1648** |
| | **එකතුව** | **33835** | **56** | **64** | **33771** |

- ප්‍රධාන පුස්තකාලයේ විනාශ කිරීමට නියමිත පොත් ලැයිස්තුව, මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලයේ විනාශ කිරීමට නියමිත පොත් ලැයිස්තුව, ප්‍රධාන පුස්තකාලයේ ඉදිරිපත් කිරීමට නොහැකි වූ පොත් ලැයිස්තුව, මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලයේ ඉදිරිපත් කිරීමට නොහැකි වූ පොත් ලැයිස්තුව, පෝරඹ ශාඛා පුස්තකාලයේ විනාශ කිරීමට නියමිත පොත් ලැයිස්තුව සහ ප්‍රධාන පුස්තකාලයේ පොත් බැඳීම සඳහා නියමිත පොත් ලැයිස්තුව ද ඉදිරිපත් කර තිබුණි.

**නිර්දේශ**

1. මෙම වාර්තාවේ ඇමුණුම 2 වශයෙන් සඳහන් වසර ගණනක් පාඨක පරිශීලනයේ පැවතිම හේතුවෙන් අබලි වී ඇති පොත් විනාශ කිරීමට හා එම පොත්වල වටිනාකම පරිග්‍රහණ ලේඛනයෙන් ඉවත් කිරීමටත්,

2. ඇමුණුම 3 ලෙස සඳහන් සමීක්ෂණය සඳහා ඉදිරිපත් නොවූ පොත්වල වටිනාකම වගකිවයුතු අදාල නිලධාරි/ සේවක මහත්ම මහත්මින්ගෙන් අයකර ගැනීමටත්,

3. ඇමුණුම 4 ලෙස දක්වා ඇති පිළිසකර කර පරිශීලනයට ගතහැකි පොත්, පොත් බැඳුම්කරු වෙත යොමුකර පිළිසකර කරවා භාවිතයට යෙදවීමටත්,

4. මිළදී ගෙන ඇති අළුත් පොත් සඳහා ප්‍රධාන පුස්තකාලයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වන බැවින් ගොඩනැගිල්ලේ උපරිම උපයෝගිතාවය ලබාගත හැකි පරිදි එහි පොත් රාක්ක වැඩි දියුණු කිරීමට හෝ අළුතින් රාක්ක එකතු කිරීමටත්, නිර්දේශ කරමු.

5. ප්‍රධාන පුස්තකාලය සඳහා 2013 වර්ෂයේ මිළදී ගත් පොත් භාවිතයට ගැනීමටත් ප්‍රථම අස්ථානගතව ඇතිබව නිරීක්ෂණය වේ. එම පොත් සඳහා දැනට සේවයේ නියුතු පුස්තකාලයාධිපතිනියට පෙර සේවය කළ පුස්තකාලයාධිපතිනිය වගකිව යුතු වේ. එම පොත්වල වටිනාකම හා රජයේ ගාස්තු අදාල නිලධාරිනියගෙන් අයකර ගැනීමට පියවර ගැනීම සුදුසුය.

6. ශාඛා පුස්තකාලවලට යොමුකිරීමට පෙර ඇතැම් අළුත් පොත් කවර බැඳීමට පියවර ගෙන නොමැති බැවින් එම අඩුපාඩුව ඉදිරියේදී මගහරවා ගැනීමට පියවර ගැනීම සුදුසුය.

7. මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලයේ පොත් බොහෝ ප්‍රමාණයක් අස්ථානගතව ඇත්තේ මහල් දෙක සඳහා එක් පුස්තකාල සහායිකාවක් සේවයේ යෙදී සිටීම හේතුවෙන් බව පෙනියන බැවින් එම පුස්තකාලයේ ඉහළ මාලය සඳහා ද පුස්තකාල සාහායිකාවක් යෙදවීම සුදුසුය.

මේ අනුව ඉහත නිර්දේශනයන් අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

**සමීක්ෂණ මණ්ඩලය**

01) ඉන්ද්‍ර පටබැඳිගේ මිය (කළමනාකරණ සහකාර I) - සභාපති

02) මිහිරි කාන්ති මිය (කළමනාකරණ සහකාර I) - සාමාජික

03) ක්‍රිෂාන්ත ද සිල්වා මයා (කළමනාකරණ සහකාර) - සාමාජික(ප.පා.දෙ.)

**අධීක්ෂණ මන්ත්‍රී**

01) ගරු නාගරික මන්ත්‍රී - ගංගේ සරත් ශ්‍රී ලාල් මහතා

02) ගරු නාගරික මන්ත්‍රී - ජේ.ඩබ්. ජයන්ත මහතා

**තීරණය**

☛ **පුස්තකාල පොත් සමීක්ෂණ මණ්ඩලය විසින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:8** ' ආදායම් හිඟ ශේෂ වාර්තා ' මැයෙන් අදාල විෂය ලිපිකරුවන් විසින් ඉදිරිපත් කර තිබූ වාර්තා සභාගත කරන ලදී.

අම්/නස/2/2 විෂයට අදාල 2013 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා අය ශීර්ෂ යටතේ ඇස්තමේන්තුගත ආදායම සහ සත්‍ය ආදායම ඇතුලත් වාර්තාවද, අම්/නස/2/3 විෂයට අදාල 2013 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා අය ශීර්ෂ යටතේ ඇස්තමේන්තුගත ආදායම සහ සත්‍ය ආදායම ඇතුලත් වාර්තාවද, අම්/නස/2/4 විෂයට අදාල 2013 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා අය ශීර්ෂ යටතේ ඇස්තමේන්තුගත ආදායම සහ සත්‍ය ආදායම ඇතුලත් වාර්තාවද, අම්/නස/2/5 විෂයට අදාල 2013 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා අය ශීර්ෂ යටතේ ඇස්තමේන්තුගත ආදායම සහ සත්‍ය ආදායම ඇතුලත් වාර්තාවද, අම්/නස/2/6 විෂයට අදාල 2013 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා අය ශීර්ෂ යටතේ ඇස්තමේන්තුගත ආදායම සහ සත්‍ය ආදායම ඇතුලත් වාර්තාවද ඉදිරිපත් කර තිබුණි.

**තීරණය**

☛ **මෙම වාර්තා සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

✪ වෙනත් කරුණු

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි මහ අම්බලන්ගොඩ බස් රථය පිළිබඳ තත්වය කොහොමද?

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ සම්බන්ධයෙන් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපතිතුමා සහ ප්‍රධාන අමාත්‍යතුමා දැනුවත් කිරීම සිදු කරල තියෙන්නෙ.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි කෙරම්ණිය පින්නදූව මාර්ග පළාත් සභා මැතිවරණයට කලින් සකස් කරල දෙන්න.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නගර සභාව අචිච්චින්න පැවැත්මක් තියෙන ආයතනයක්. කවුරු මාරු වුනත් වැඩ කෙරෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමනි මේ පළාත් පාලන කොමසාරිස්තුමා විසින් එවපු ලිපියක් තියෙනවා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔය සම්බන්ධයෙන් පෙත්සම් කාරක සභාවෙන් අපිට එන්න කියල තිබුණ. එදා අදාල එක් පාර්ශව කරුවකු ඇවිල්ල තිබුනෙ නෑ. අපි ගියා. දෙවනි දවසෙ අපට සභාව දවසක් නිසා අපි වෙනත් දිනයක් ඉල්ලුවා. අපෙන් කරුණු විමසීමක් නැතිවම ඒගොල්ලො තීන්දුවක් අරගෙන තියෙනවා. සත්‍ය තත්වය ඔය පාර්ශව දෙකම වැරදියි. නීත්‍යානුකූලව කරනව නම් දෙන්නටම නඩු දාන්නයි වෙන්නෙ. ඒකෙන් වෙන්නෙ දෙන්නටම නිරස ප්‍රතිඵලයක් ලැබෙන එක.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි මේ වෝල්ටර් මහත්තය කියන්නෙ ඒ මහත්මයට අසාධාරණයක් වෙලා කියලා. මේක දිගින් දිගටම යන දෙයක් නිසා මේකට විසඳුමක් තියෙන්න ඕනෙනෙ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේකට සැලසුම් කමිටුවෙදි වෝල්ටර් මහත්මයට දන්වල තියෙනව මැද බිත්තියේ තියෙන කවුලුව වහන්න කියලා. අනිත් පාර්ශවයට කියල තියෙනවා තාප්පයට අල්ලා ඇති කරාමය ඉවත් කරන්න සහ මල් පෝච්චි ඉවත් කරන්න කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමනි ඔය කරන්න කියපුව කරලද කියල නිලධාරී මහත්මයෙක් යවල පරීක්ෂණයක් කරන්න.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේක සිවිල් ප්‍රශ්නයක්. අපිට විසඳන්න බැහැ. නගර සභාව කියන්නෙ පොලිසිය නෙමෙයිනෙ.

ප. ව. 12.50 ට පමණ සභාව සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

ප. ව. 01.00 ට පමණ කාරක සභා අවස්ථාව අවසන් කරන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

සභාපතිතුමනි ස්වයංරැකියා අලෙවිසැල් ලබා දීම කෙහොමද?

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මන්ත්‍රීවරු කරන්න ඕන දේ කියන්න. මම කරන්නම්.

**ප. ව. 01.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

භාරත සමරසේකර,
ලේකම් ,
අම්බලන්ගොඩ නගර සභාව.

වැල්ලගේ කමල් ද සිල්වා,
සභාපති (වැ. බ.),
අම්බලන්ගොඩ නගර සභාව.

**2014 – 02 – 25 දින,**
**අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.**